# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 14,903 — 1970 අප්‍රේල් 24 වැනි සිකුරාදා — 1970.4.24**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — | ආණ්ඩුවේ නිවේදන ... ... ... | 326 |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය ... ... | 323 | මිළ පාලන දැන්වීම් ... ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | — | ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | 324 | ආදායම හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| වෙනත් පත් කිරීම් ආදිය ... ... ... | 326 | ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... ... | — | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 328 |
| | | " සුරාබද්ධ ආඥාපනත " පිළිබඳ දැන්වීම් ... ... | — |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම් ආදිය

**1970 අංක 136**

අංකය : සී. 41/ආර්ජීසී/(II).

### යුද්ධ හමුදාව—ස්ථිර බල හමුදාව—අග්‍රාණ්ඩුකාරතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද පත් වීමක්

පහත නම සඳහන් නිලධාරියා 1970 පෙබරවාරි මස 20 වැනි දින සිට යුද්ධ හමුදා වැටුප් පාලක හා ලේඛන භාර නිලධාරි වශයෙන් වැඩ බැලීමට :—

මේජර් ප්‍රැන්සිස් සෝමරත්න කස්තුරිආරච්චි, ල. යු. පොදු සේ. බ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඩබ්ලිව්. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
වැඩ බලන ස්ථිර ලේකම්.

1970 අප්‍රේල් මස 10 දින,
කොළඹ දී ය.

4-747

**1970 අංක 137**

අංකය : සී. 21/ආර්ජීසී/402.

### යුද්ධ හමුදාව—ස්ථිර බල හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් නිලධාරියා 1970 අප්‍රේල් මස 8 වැනි දින සිට යුද්ධ හමුදා සථිර බල හමුදාවෙන් විශ්‍රාම ගෙන ඇත :—

ලුතිනන් (උපකරණ පාලක) දොන් ඇන්ඩෲ ජයමාන්න, ල. යු. සේ. බ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඩබ්ලිව්. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
වැඩබලන ස්ථිර ලේකම්.

1970 අප්‍රේල් මස 12 දින,
කොළඹ දී ය.

4-754

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

### විශේෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 14 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

ඇල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

**1970 අංක 138**

අංකය : ඩී/වීඑෆ්/22/ඒ (II).

**යුද්ධ හමුදාව—ලංකා ස්වේච්ඡා බලසේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද නිලය ස්ථිර කිරීමක්**

1968 අප්‍රේල් මස 1 වන දින සිට මේජර් වශයෙන්—

කපිතාන් (තාවකාලික මේජර්) චන්ද්‍රා තිස්සංක පානබොක්කේ, ලංසිරෙ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඩබ්ලිව්. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
වැඩ බලන ස්ථිර ලේකම්.

1970 අප්‍රේල් මස 11 දින,
කොළඹ දී ය.

4-745

---

**1970 අංක 139**

අංකය : ඩී/වීඑෆ්/10/ඒ (II).

**යුද්ධ හමුදාව—ලංකා ස්වේච්ඡා බලසේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක්**

1970 ජනවාරි මස 1 වැනි දින සිට මේජර් වශයෙන්—

කපිතාන් වීරසිංහ ජෙරාඩ් ඇන්ටන් සිල්වා, ලයුවෙබ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඩබ්ලිව්. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
වැඩ බලන ස්ථිර ලේකම්.

1970 අප්‍රේල් මස 11 දින,
කොළඹ දී ය.

4-746

---

**1970 අංක 140**

අංකය : ඩී/වීඑෆ්/10/ඒ (II).

**යුද්ධ හමුදාව—ලංකා ස්වේච්ඡා, බලසේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්**

කපිතාන් (උපකරණ පාලක) එරික් තියඩෝසියස් ද අල්විස්, ලයුවෙබ, 1970 ජනවාරි මස 1 වැනි දින සිට යුද්ධ හමුදාවේ ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගෙන ඇත.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඩබ්ලිව්. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
වැඩබලන ස්ථිර ලේකම්.

1970 අප්‍රේල් මස 13 දින,
කොළඹ දී ය.

4-753

---

**1970 අංක 141**

අංකය : ඩී. 251/ආර්ඊසීටී/3.

**රාජකීය ලංකා නාවික හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක්**

1970 මාර්තු මස 1 වැනි දින සිට ලුතිනන් කොමාන්ඩර් පදවියට—

ලුතිනන් ඊ. පී. ඩී. කැස්පර්ස්, රා. ලං. නා. හ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඩබ්ලිව්. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
වැඩ බලන ස්ථිර ලේකම්.

1970 අප්‍රේල් මස 11 දින,
කොළඹ දී ය.

4-743

---

**1970 අංක 142**

අංකය : ඩී. 252/ආර්ඊසීටී/4.

**රාජකීය ලංකා ගුවන් හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක්**

1970 මාර්තු මස් 1 වෙනි දින තාවකාලික විං කොමාන්ඩර් වශයෙන්—

ස්කොඩ්රන් ලීඩර් මනම්පේරි කෝරලේගේ දොන් සිල්වෙස්ටර් චන්ද්‍රපාල (01038)—උපකරණ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඩබ්ලිව්. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
වැඩ බලන ස්ථිර ලේකම්.

1970 අප්‍රේල් මස 10 දින,
කොළඹ දී ය.

4-744

---

## අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය

**1970 අංක 143**

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කර ඇත්තේ ය:—

අංකය : ජේඑම්/ජී. 40/66.

එල්. එස්. පෙරේරා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, වී. එන්. ඒ. ඩබ්ලිව්. වික්‍රමසූරිය මහතා, 1970 අප්‍රේල් මස 7 වැනි දින සිට 15 වැනි දින දක්වා, රත්නපුර මහෙස්ත්‍රාත් තැන, නාගරික මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : සී. ජේ. පී/ඩබ්ලිව්. 16/69.

ඊ. ඒ. විජේකුලසූරිය මහතා 1970 අප්‍රේල් මස 1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, තුන් අවුරුදු ආධුනිකත්‍ව කාල සීමාවකට යටත්ව ලංකා අධිකරණ සේවයේ නිලධාරියෙකු වශයෙන්.

අංකය : ජේඑම්/ජී. 40/66.

එම්. ෂන්මුගලිංගම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඊ. ඒ. විජේකුලසූරිය මහතා 1970 අප්‍රේල් මස 8 වැනි දින සිට 22 වැනි දින දක්වා, හැටන්හි පිහිටි උසාවියේ ක්‍රියා කරන නුවරඑළියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, හැටන්හි ළමා මහෙස්ත්‍රාත් තැන සහ බදුල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑම්/ජී. 40/66.

කේ. ඩී. ඕ. එස්. එම්. සෙනෙවිරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එම්. පී. විජේසිංහ මහතා, 1970 මාර්තු මස 9 වැනි දින සිට 25 වැනි දින දක්වා, අවිස්සාවේල්ලේ දිස්ත්‍රික් නඩුකාර තැන, රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඒ. 47/48 (III).

එම්. ඒ. එම්. හුසේන් මහතා ඔහුගේ වෙනත් රාජකාරී වලට අතිරේක වශයෙන්, පානදුර දිස්ත්‍රික් උසාවියේ අංක 7594 දරණ නඩුව ඇසීමට සහ අසා නිමකර තීන්දුව දීම පිණිස, 1970 අප්‍රේල් මස 3 දින සිට පානදුර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඒ. 5/48.

ජේ. යෝනාතිරාජා මහතා ඔහුගේ වෙනත් රාජකාරීවලට අතිරේක වශයෙන් බදුල්ල ම. උ. අංක 31,597, 31,598, 31,599 සහ 31,600 දරණ නඩුවල තීන්දු දීම පිණිස, 1970 මැයි මස 3 දින සිට බදුල්ල අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඒ. 14/68.

සී. අමරසිංහ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, පී. වී. බෙ.තේජු මහතා 1970 අප්‍රේල් මස 5 දින සිට 9 වැනි දින දක්වා, හෝමාගම පිහිටි උසාවියේ ක්‍රියා කරන කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩබ්ලිව්. 12/66.

එන්. බී. ඕ. එස්. විජේසේකර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එන්. ජේ. වී. කුරේ මහතා 1970 අප්‍රේල් මස 9 දින සිට 12 වැනි දින දක්වා, කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩබ්ලිව්. 12/66.

එන්. බී. ඕ. එස්. විජේසේකර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, සිසිල් ඊ. පෙරේරා මහතා 1970 අප්‍රේල් මස 16 දින සිට 18 වැනි දින දක්වා, කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩබ්ලිව්. 18/69.

වී. එන්. ඒ. ඩබ්ලිව්. වික්‍රමසූරිය මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එස්. සුරවීර මහතා 1970 අප්‍රේල් මස 5 දින, කෑගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/පී. 13/64.

එස්. බී. ගුණවර්ධන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, බී. පින්තු මහතා 1970 අප්‍රේල් මස 12 දින සිට 16 වැනි දින දක්වා, හලාවත සහ පුත්තලමේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ජී. 13/64.

එස්. බී. ගුණවර්ධන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. එස්. රාජපක්ෂ මහතා 1970 අප්‍රේල් මස 5 දින සිට 11 දින දක්වා, හලාවත සහ පුත්තලමේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ජේ. 11/61.

එම්. ජමීල් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඩබ්ලිව්. ඊ. පෙරේරා මහතා 1970 මාර්තු මස 26 දින සිට 30 දින දක්වා, ගම්පහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩී. 30/66.

ජී. සී. ඩබ්ලිව්. ද සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඩී. සේරසිංහ මහතා 1970 මාර්තු මස 27 වැනි දින, තංගල්ල අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ හම්බන්තොට අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ජී. 14/65.

එල්. ඒ. ගුණවර්ධන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එල්. ඩබ්ලිව්. ප්‍රනාන්දු මහතා 1970 අප්‍රේල් මස 5 වැනි දින සිට 11 වැනි දින දක්වා, ගම්පොල ක්‍රියා කරන මහනුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, ගම්පොල අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඒ. 10/63.

ජී. එෆ්. එච්. අතුරුපාන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එච්. ඊ. එස්. වික්‍රමරත්න මහතා 1970 මාර්තු මස 28 දින, කොළඹ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ දෙහිවල ගල්කිස්ස අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩබ්ලිව්. 16/69.

ඊ. ඒ. විජේකුලසූරිය මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, සී. තියාගරාජා මහතා 1970 මාර්තු මස 26 දින සිට 31 වැනි දින දක්වා, මාතලේ ක්‍රියා කරන මහනුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, මාතලේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/පී. 9/67.

එල්. එස්. පෙරේරා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එෆ්. ආර්. වීරසේකර මහතා 1970 අප්‍රේල් මස 5 සහ 6 වැනි දිනයන් හී, රත්නපුර අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : පීඑච්/8/57.

ජේ. ඊ. ඉලංගන්තිලක මහතා 1970 මාර්තු මස 31 වැනි දින සිට විලල ගම්බද උසාවියේ අංක 6182 දරණ අපරාධ නඩුව ඇසීමට සහ අසා නිමකර තීන්දුව දීම පිණිස, මහනුවර දිස්ත්‍රික්කයේ පාත දුම්බර සහ උඩ දුම්බර අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/කේ. 8/64.

එස්. කඩවතආරච්චි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ජී. සූරියආරච්චි මහතා 1970 මාර්තු මස 9, 10 සහ 11 වැනි දිනයන් හී, කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුලියාපිටිය, පන්නල, බිංගිරිය සහ දෙවමැදි හත්පත්තුවේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයන් හී ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඒ. 10/61.

එච්. අමීන් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, කේ. ඒ. අරසකෝන් මහතා 1970 අප්‍රේල් මස 1 වැනි දින සිට 5 වැනි දින දක්වා, මඩකලපුව දිස්ත්‍රික්කයේ එරාවූර් කෝරලේ බින්තැන්න පත්තු සහ උතුරු මාම්මුනෙයි පත්තු ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑච්/18/57.

බී. එම්. එස්. ඒකනායක මහතා 1970 මාර්තු මස 23 වැනි දින සිට දම්පහල ගම්බද උසාවියේ අංක 2385 දරණ සිවිල් නඩුව ඇසීමට සහ අසා නිමකර තීන්දුව දීම පිණිස, මාතර දිස්ත්‍රික්කයේ මොරවක් කෝරළේ ගම්බද උසාවි සභාපති සහ වැලිගම් කෝරලේ සහ ගඟබොඩ පත්තුවේ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/බී. 7/59.

සුධර්මා ධර්මදාස මහත්මිය නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, නීල් ද ජැකොලයින් සෙනෙවිරත්න මහතා 1970 මාර්තු මස 20 වැනි දින, අවිස්සාවේල්ල දිස්ත්‍රික්කයේ දෙහිගම් පල් කෝරලේ, පහල බුලත්ගම, අටළුගම් සහ පනාවල් කෝරලේ ගම්බද උසාවි සභාපති සහ බෙලිගල් කෝරලේ සහ කුරුවිටි කෝරලේ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑච්/24/59.

කේ. කනපතිපිල්ලේ මහතා 1970 අප්‍රේල් මස 4 වැනි දින සිට චැම්පියන් පත්තු ගම්බද උසාවියේ අංක 465 දරණ අපරාධ නඩුව සහ අංක 358 දරණ සිවිල් නඩුව ඇසීමට සහ අසා නිමකර තීන්දු දීම පිණිස, ජෝදුරුතුඩුව දිස්ත්‍රික්කයේ තෙන්මරච්චි, පච්චිලයිප්පලි, කරච්චි සහ පූනාකරී තුන්නුකායි අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එස්. 7/49.

කේ. සින්නතම්බි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, පී. වී. සෝනාධිරාජා මහතා 1970 මාර්තු මස 26 වැනි දින සහ 31 වැනි දිනයන් හී, වව්නියා සහ මන්නාරම් දිස්ත්‍රික්කයන් හී වව්නියා දකුණ ගම්බද උසාවි සභාපති සහ මාන්තෙයි අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

සිරිමෙවන් අමරසිංහ,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ
ලේකම්.

1970 අප්‍රේල් මස 9 ද,
කොළඹ 12,
තැ. පෙ. අංක 573,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී.

4-656

## වෙනත් පත් කිරීම් ආදිය

### 1970 අංක 144

පා 4/සාවි 18/19, පා 4/සාවි 18/21, පා 4/සාවි 14/76,
පා 4/සාවි 6/29, පා 4/සාවි 28/131, පා 4/සාවි 28/57,
පා 4/සාවි 28/118, පා 4/සාවි 14/113, පා 4/සාවි 3/102,
පා 4/සාවි 20/141, පා 4/සාවි 2/89, පා 4/සාවි 16/62.

**අධිකරණ ආඥාපනත**

**82 වන වගන්තිය යටතේ දැන්වීම**

(6 වන අධිකාරය වූ) අධිකරණ ආඥාපනතෙහි 82 වන වගන්තිය යටතේ මා වෙත පැවරුණු බලතල ප්‍රකාර, අධිකරණ ඇමති, ඇලෙක්සැන්ඩර් ෆේපයාර්ලි විජේමාන්න වන මම,

(1) වනසිංහ මුදියන්සේලාගේ කල්‍යාණපාල අබේගුණවර්ධන මහතා තංගල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

(2) දොන් චාර්ලිස් වික්‍රමසේකර රාජපක්ෂ මහතා තංගල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

(3) මොරම්පිටිය හේවාගේ හෙන්රි ආරියරත්න මහතා ගාල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

(4) දොන් තිදසපේම විජේසිංහ මහතා අවිස්සාවේල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

(5) සිංහනායගේ සිසිරුවන් ජයනාග මහතා කුරුණෑගල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

(6) ජයසුන්දර මුදියන්සේලාගේ පුන්චිබණ්ඩා මහතා කුරුණෑගල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

(7) හේරත් මුදියන්සේලාගේ හේරත් බණ්ඩා හේරත් මහතා කුරුණෑගල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

(8) ලොකුවඩුගේ මාෂල් මහතා ගාල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

(9) බෝගහවත්තගේ පියදස වෛද්‍යතිලක මහතා කළුතර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

(10) ගන්දවතනම් වයිරමුත්තු සුබ්‍රමනියම් මහතා පේදුරුතුඩුව අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

(11) සුලේමන් ලෙබ්බේ මොහමඩ් මහතා ගම්පහ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

(12) මුහන්දිරම්ගේ පීටර් ජයවීර මහතා මාතර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

පත් කරමි.

ඒ. එෆ්. විජේමාන්න,
අධිකරණ ඇමති.

1970 අප්‍රේල් මස 17 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

4-802

---

### 1970 අංක 145

අංකය : ඊබී/ඒ—258/2.

පහත සඳහන් පත්වීම් කිරීමට ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා සතුටුවී ඇත :—

බදුල්ල පාලන දිස්ත්‍රික්කයේ වැඩබලන ආණ්ඩුවේ ඒජන්ත ඒ. මාදෙන මහතා, 1970 මාර්තු මස 16 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, ස්වකීය රාජකාරිවලට අතිරේකව, බදුල්ල පාලන දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් පැට්රෝල් ආඥාපනත යටතේ ප්‍රාදේශීය අධිකාරි.

ඇ. එ. ගෝගලි මොරගොඩ,
ස්ථිර ලේකම්.

ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
ටොරිංටන් චතුරශ්‍රය,
කොළඹ 7,
1970 මාර්තු මස 31 වන දින.

4-662

### 1970 අංක 146

අංකය : ඊබී/ඒ—204/3.

අර්ථ නිරූපන ආඥාපනතේ දෙවන පරිච්ඡේදය 10 බී වැ
වගන්තිය යටතේ අංක 10,123 සහ වර්ෂ 1950 ජූලි මස 14 වැනි දි
දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරන ලද නිවේදනයෙ
තමන් වෙත පැවරී ඇති බලතල අනුව ස්වදේශ කටයුතු පිළි
අමාත්‍යාංශයෙහි ස්ථිර ලේකම් විසින් පහත සඳහන් පත්වීම් ක
ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ :—

බදුල්ල පාලන දිස්ත්‍රික්කය භාර වැඩබලන ආණ්ඩුවේ ඒජන්ත
මාදෙන මහතා, 1970 මාර්තු මස 16 වැනි දින සිට නැවත නිය
යක් කරන තුරු, ස්වකීය රාජකාරිවලට අතිරේකව ඌව පළාත
පිස්කල්, බදුල්ල පාලන දිස්ත්‍රික්කයේ රේගු අයකැමි ස
බදුල්ලේ බන්ධනාගාර අධිකාරි.

රත්නපුර පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තගේ කාර්යා
සහකාර කේ. බී. පී. ද සිල්වා මහතා, 1970 මාර්තු මස 1 වැ
දින සිට නැවත නියමයක් කරන තුරු, ස්වකීය රාජකාරිවලට
අතිරේකව, රත්නපුර පාලන දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය පිස්කා

ඇ. එ. ගෝගලි මොරගො
ස්ථිර ලේකම්.

ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
ටොරිංටන් චතුරශ්‍රය,
කොළඹ 7,
1970 මාර්තු මස 31 වැනි දින.

4-661

---

### 1970 අංක 147

**නොතාරිස් ආඥාපණත (107 වන අධිකාරය)**

සිවසංගාරම් බාලේන්ද්‍රන් මහතා පේදුරුතුඩුව සහ චාවකච්චේ
අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලිය
නොතාරිස් කෙනෙකු වශයෙන් ස්වදේශ කටයුතු පිළිබඳ ග
ඇමතිතුමා විසින් පත්කර තිබේ.

ඇ. එ. ගෝගලි මොරගොඩ,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේක

1970 ක්වූ අප්‍රියෙල් මස 7 වැනි දින,
කොළඹ දීය.

4-615

---

## ආණ්ඩුවේ නිවේදන

**1949 අංක 6 දරණ උගස් පණත යටතේ ණය දෙ
"ඒජන්සි" ආදිය අනුමත කිරීම සඳහා වන මණ්ඩලයේ
සාමාජිකවරු**

වර්ෂ 1949යේ අංක 6 දරණ උගස් පනතේ 114 (1) වගන්
යහ 1966 නොවැම්බර් මස 12 වෙනි දින පළ වූ අංක 14,721/3 දර
ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනය යටතේ
වාණිජ හා වෙළඳ ගරු ඇමතිතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රක
එකී පනතේ කටයුතු සඳහා පනවා ඇති මණ්ඩලයේ සාමාජ
මහතෙකු වශයෙන් එස්. ආර්. ද සිල්වා මහතා 1970 ජනවාරි මස 1
වෙනි දින සිට තවත් තුන්අවුරුද්දක කාලසීමාවකට ගරු ඇමතිතු
විසින් පත් කරනු ලැබ ඇති බව මෙයින් නිවේදනය කරමි.

පී. ඒ. සිල්වා,
වාණිජ හා වෙළඳ අමාත්‍යාංශයේ
සථිර ලේකම්.

1970 මාර්තු මස 25 වෙනි දින,
කොළඹ දී ය.

4-617

---

අංකය : 543ඊ/141 ඩී (VII කොටස).

මෙයට ඇතුළත් උපලේඛනයෙහි II වැනි තීරයෙහි නියමි
දෙපාර්තමේන්තුවෙහි එයට අනුරූපව I වැනි තීරයෙහි නියමි
එක් එක් තනතුර දරන සෑම තැනැත්තෙකුම ඒ තනතුර
පත්කරනු ලැබූ දින සිට විශ්‍රාම වැටුප් ලැබීමට සුදුසුකම් ඇත්තෙ
බව විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 2 වැනි වගන්තිය ප්‍රකාර සහ ඒ
ව්‍යවස්ථාවල විධිවිධානයන්ට යටත්ව දන්වනු ලැබේ.

ඇම්. රාජේන්ද්‍ර,
භාණ්ඩාගාරයේ ලේකම්.

1970 අප්‍රේල් මස 5 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දීය.

## උපලේඛනය

| I වැනි තීරය | II වැනි තීරය |
|---|---|
| I ශ්‍රේණියේ උපදේශක (ඉංග්‍රීසි), ලංකා උසස් කාර්මික විද්‍යායතනය (1967.9.1 දින සිට ජේ. වී. ඇම්. ගුණවර්ධන මහතා විසින් දරණ තාක් කල්) පාඨශාලා ගොඩනැගිලි අධ්‍යක්ෂ | අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය |
| ලේකම් ... | නීති කොමිෂන් සභාව |
| සනීපාරක්ෂක හා උද්‍යාන කම්කරුවන් ... | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව |
| පොටෝස්ටැට් ක්‍රියා කරවන්නන් ... | මිණින්දෝරු දෙපාර්තමේන්තුව. |
| වේලා සටහන් කරුවන් ... | ආහාර දෙපාර්තමේන්තුව. |
| III ශ්‍රේණියේ විදුලි පෝර්මන් ... | ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව. |

4-622

---

ඇල්.ඩී.—බී 43/34.

## රෙජිස්ට්‍රාර්වරුන්ගේ නීති කෘත්‍ය වලංගු කිරීමේ ආඥා පනත

(121 වෙනි අධිකාරය වන) රෙජිස්ට්‍රාර්වරුන්ගේ නීති කෘත්‍ය වලංගු කිරීමේ ආඥාපනතේ 3 වෙනි වගන්තිය යටතේ තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් පනවන ලද ආඥාව.

වී. දහනායක,
ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති.

1970 මාර්තු 11 වෙනි දින,
කොළඹ දීය.

### ආඥාව

මෙහි උපලේඛනයේ I වෙනි තීරයෙහි නිශ්චිතව සඳහන් විවාහය ලියාපදිංචි කිරීම වලංගු නොවීමට හේතු වශයෙන් එම උපලේඛනයේ II වෙනි තීරයෙහි දී ඇති කරුණු ලියාපදිංචි කිරීමේදී නොපැවති සේ සලකා, සියලු කාර්යයන් සඳහා එම විවාහය වලංගු හා බල සහිත ලෙස සැලකිය යුතුය.

### උපලේඛනය

| I වැනි තීරය | II වෙනි තීරය |
|---|---|
| බදුල්ල දිස්ත්‍රික්කයේ යටිකිඳ කොට්ඨාශයේ වැඩ බලන විවාහ රෙජිස්ට්‍රාර් වශයෙන් ඇම්. ආර්. ඇම්. සුමනාවතී කුමාරිහාමි මහත්මිය විසින් කරන ලද අංක 2925 හා 1969. 4. 24 දින දරණ විවාහ සටහන. | වැඩ බැලීමට විධිවූ පරිදි පත් කරනු ලැබ සිටි රෙජිස්ට්‍රාර් වරිය වූ ඇම්. ආර්. ඇම්. සුමනාවතී කුමාරිහාමි මහත්මිය මෙම විවාහය සිදුකරන අවස්ථාවේදී ඒ ස්ථානයේ නොසිටි අතර 35 වෙනි වගන්තිය යටතේ විවාහය ඇත්ත වශයෙන්ම සිදුකර ඇත්තේ විධි වූ පරිදි රෙජිස්ට්‍රාර්වරයෙකු වශයෙන් පත් කරනු ලැබ නොසිටි පුද්ගලයෙකු විසිනි. |

4-691

---

## පඩිපාලක සභා ආඥාපනත

### නිවේදනයයි

රෙදිපිළි නිෂ්පාදන කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයකුව සිට ඉල්ලා අස්වූ ඊ. ඇස්. ද සිල්වා මහතා වෙනුවට එම පඩිපාලක සභාවේ සේව්‍ය නියෝජිත සාමාජිකයකු ලෙස පෙනී සිටීමට පඩිපාලක සභා ආඥාපනතේ (136 වැනි අධිකාරය) 9 වන වගන්තිය යටතේ ගරු කම්කරු හා රැකීරක්ෂා ඇමතිතුමන් විසින් ඇන්. යූ. ජයවර්ධන මහතා පත්කරන ලද බව වර්ෂ 1943 පඩිපාලක සභා ව්‍යවසථා සංග්‍රහයේ 26 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජී. ඩී. තම්බයියා,
සහිර ලේකම්,
කම්කරු හා රැකීරක්ෂා අමාත්‍යාංශය.

1970 අප්‍රියෙල් මස 10 වැනි දින,
කොළඹදීය.

4-636

---

## 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

### 49 ඡේදය යටතේ සහතිකය

විද්‍යාත්මක පර්යේෂණ හා නිවාස ඇමති, මහබාලගේ දොන් හෙන්රි ජයවර්ධන වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡේදය යටතේ මාවෙත පවරා ඇති බලතල උඩ, මෙහි පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡේදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගතයුතු බව මෙයින් සහතික කරමි.

ඇම්. ඩී. එච්. ජයවර්ධන,
විද්‍යාත්මක පර්යේෂණ හා නිවාස ඇමති.

1970 මාර්තු 27 දින,
කොළඹ දීය.

### උපලේඛනය

බස්නාහිර පලාතේ කොළඹ දිස්ත්‍රික්කයේ පිළියන්දල ප්‍රාදේශීය ආදායම් නිළධාරි කොට්ඨාශයේ මොරටුව නගර සභා සීමාව තුල මොරටුවැල්ලේ කෙලින් වීදියේ වරිපනම් අංක 213 දරණ පවුරුගහ වත්ත නමැති ඉඩමෙන් අංක 3779ඒ දරණ සැලැස්මේ ලොට් අංක ඒ. බී. සහ සී දරණ පර්චස් 18.25 ක පමණ පහත සඳහන් පරිදි මායිම් ඇති ඉඩම් කොටස් :—

උතුරට : අඩිපාර ;

නැගෙනහිරට : අඩිපාර ;

දකුණට : කරත්ත පාර සහ ජී. එම්. ප්‍රනාන්දු ට අයිති ඉඩම ;

බස්නාහිරට : ඉහත සැලැස්මේ ලොට් ඩී. ඊ. සහ එෆ්. දරණ ඉඩම් කොටස්.

4-657

---

## නොතාරිස් ආඥාපනත (107 අධිකාරය)

කුරුණෑගල අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් ජයරත්න ලංකා තිලක මහතාට එම අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ද නොතාරිස් කෙනෙකු වශයෙන් කටයුතු කිරීමට ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමති තුමා විසින් අවසර දී තිබේ.

ඇ. එ. ගෝගලි මොරගොඩ,
සවදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ සහිර ලේකම්.

1970 අප්‍රේල් මස 7 වැනි දින,
කොළඹදී ය.

4-668

---

## නොතාරිස් ආඥාපනත (107 අධිකාරය)

කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් ඇඩ්රියන් රොඩ්නි මැතිව් මහතාට එම අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ද නෝතාරිස් කෙනෙකු වශයෙන් කටයුතු කිරීමට ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමති තුමා විසින් අවසර දී තිබේ.

ඇ. එ. ගෝගලී මොරගොඩ,
සවදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ සහිර ලේකම්.

1970 අප්‍රේල් මස 7 වැනි දින,
කොළඹදී ය.

4-667

---

## නොතාරිස් ආඥාපනත (107 අධිකාරය)

කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් කලුතන්ත්‍රිගේ උදිත ඉන්ද්‍රාණී ජයවීර බණ්ඩාර මෙනෙවියට එම අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ද නොතාරිස් කෙනෙකු වශයෙන් කටයුතු කිරීමට ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමති තුමා විසින් අවසර දී තිබේ.

ඇ. එ. ගෝගලී මොරගොඩ,
සවදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ සහිර ලේකම්.

1970 අප්‍රේල් මස 7 වැනි දින,
කොළඹදී ය.

4-666

## නොතාරිස් ආඥාපනත (107 අධිකාරය)

මීගමුව අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් මල්නයිදෙලාගේ ජෝන් සරත්චන්ද්‍ර ගුණරත්න මහතාට එම අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ද නොතාරිස් කෙනෙකු වශයෙන් කටයුතු කිරීමට ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමති තුමා විසින් අවසර දී තිබේ.

ඇ. එ. ගෝගලි මොරගොඩ,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 අප්‍රේල් මස 5 වැනි දින,
කොළඹදී ය.

4-669

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

ණ. 5331.

## ලංකා රජයේ උකස් බැංකුව

ලංකා රජයේ උකස් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 1967 ඔක්තෝබර් 14 වෙනි දින පවත්වන ලද රැස්වීමේ දී පහත සඳහන් පරිදි විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කර සම්මත කරන ලදී :—

(1) ඊ. එෆ්. ද සිල්වා ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කරන ලද අංක 491 හා 1959 සැප්තැම්බර් 3 වෙනි දින දරණ උකස්කරය මත අංගොඩ, ගොතටුවේ, නින්දගේන, අංක 607 දරණ තැන, තුප්පහිගේ දෝන සේතුහාමිනේ නමැත්තියගෙන් 1967.8.7 දින දක්වා මුල් මුදල හා පොළිය වශයෙන් රු. 2,198.26 ක මුදලක් හා 1967.8.8 දින සිට ගෙවනු ලබන දින තෙක් රු. 2,032.84ක මුදල මත සියයට 5½ පොළියක් තවදුරටත් ලැබිය යුතුය.

(2) ලංකා රජයේ උකස් බැංකු ආඥපනතේ (398 අධිකාරය) 61 (1) වගන්තියේ ප්‍රකාර පහත සඳහන් දේපොළ මේ තීරණය රජයේ ගැසට් පත්‍රයේ පළවීමෙන් දින 21 ක් ගත වීමෙන් පසු මින් මතු නියම කරනු ලබන දිනක ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළඹ 12, අළුත්කඩේ වීදියේ, අංක 161/32 දරණ තැන, එම්. වින්සන්ට් පෙරේරා වෙන්දේසිකරුට අවසරය හා බලය දෙන ලදී.

ඉහත කී තුප්පහිගේ දෝන සේතුහාමිනේ නමැත්තියගෙන් ඉහත සඳහන් උකස්කරය මත අය විය යුතු රු. 2,198.26 ක මුදල සහ 1967.8.8 සිට වෙන්දේසිය පැවැත්වෙන දින දක්වා රු. 2,032.84 ක මුදල මත අවුරුද්දකට සියයට 5½ බැගින් පොළියද, ලංකා රජයේ උකස් බැංකු ආඥපනතේ 63 වෙනි වගන්තිය යටතේ අය කර ගත හැකි වියහියදම් හා මුදල් ද අය කර ගනු සඳහා, මෙම බැංකුවට ඇප වශයෙන් උකස් කර ඇති—

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ රාගම් පත්තුවේ අළුත්කුරු කෝරළේ ගොතටුවේ පිහිටි පිටමගුරකුඹුර නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු වී. කාතිගේසු විසින් සාදන ලද 1952 සැප්තැම්බර් 30 දින දරණ හා අංක 1244 දරණ පිඹුර අනුව, පර්චස් දහයයි දශම දෙකයි පහක් වූ අංක 4 දරණ බිම් කොටස ලෙස සළකුණු කරන ලද ඉඩම් කට්ටිය හා එහි ඇති ගොඩනැගිල්ල.

එච්. බී. කපුවත්තේ,
සාමාන්‍යාධිකාරී.

1970 මාර්තු 10.

4-774

---

ණ. 4829

## ලංකා රජයේ උකස් බැංකුව

ලංකා රජයේ උකස් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 1968 ජූනි 1 වෙනි දින පවත්වන ලද රැස්වීමේදී පහත සඳහන් පරිදි විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කර සම්මත කරන ලදී :—

(1) එම්. ටී. ගුණවර්ධන ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් සහතික කරන ලද 1959 මැයි 26 දින හා අංක 232 දරණ උකස්කරය මත වත්තල, තෙලඟපාත පාරේ අංක 109 දරණ තැන වාද්දුවගේ දොන් ආතර් ප්‍රෙඩ්රික් රණසිංහ යන අයගෙන් 1968.2.22 දින දක්වා මුදල් මුදල හා පොළිය වශයෙන් රු. 22,719.74 ක මුදලක් හා 1968.2.23 දින සිට ගෙවනු ලබන දින තෙක් රු. 20,000.43 ක මුදල මත අවුරුද්දකට සියයට 5½ ක පොළියක් තවදුරටත් ලැබිය යුතුයි.

(2) ලංකා රජයේ උකස් බැංකු ආඥ පනත් (398 අධිකාරය, 62(1) වගන්තියේ ප්‍රකාර පහත සඳහන් දේපොළ මේ තීරණය රජයේ ගැසට් පත්‍රයේ පළවීමෙන් දින 21 ක් ගත වීමෙන් පසු මින් මතු නියම කරන දිනක ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළඹ 1, කැනල් රෝ හි, අංක 35 දරණ තැන වින්ස්ටන් මෙලිස් ප්‍රනාන්දු වෙන්දේසිකරුට අවසරය හා බලය දෙන ලදී.

ඉහත කී වාද්දුවගේ දොන් ආතර් ප්‍රෙඩ්රික් රණසිංහ යන අයගෙන් ඉහත සඳහන් උකස්කරය මත අය විය යුතු රු. 22,719.74 ක මුදල සහ 1968.2.23 දින සිට වෙන්දේසිය පැවැත්වෙන දින දක්වා රු. 20,000.43 ක මුදල මත අවුරුද්දකට සියයට 5½ බැගින් පොළියද, ලංකා රජයේ උකස් බැංකු ආඥ පනතේ 63 වෙනි වගන්තිය යටතේ අය කර ගත හැකි වියහියදම් හා මුදල් ද අය කර ගනු සඳහා, මෙම බැංකුවට ඇප වශයෙන් උකස් කර ඇති—

1. බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ අළුත්කුරු කෝරළේ රාගම් පත්තුවේ වත්තල-මාබෝල පළාත් ආණ්ඩු සභා මායිම් තුළ පිහිටි තෙලඟපාත, තෙලඟපාත පාරේ, පී. අයි. ඒ ආනන්දප්පා බලයලත් මිනින්දෝරු තැන විසින් සාදන ලද අංක 1183 දරණ පිඹුර අනුව 1ඒ වශයෙන් සලකුණු කර ඇති එම අංක 1183 දරණ පිඹුර අනුව ප්‍රමාණයෙන් රූඩ් එකක් හා පර්චස් දහහතක් වූද (අ. 0, රූ. 1, පර්. 17), කැටකැලගහවත්ත නමැති ඉඩමේ එකී බිම් කොටස හා වරිපනම් අංක 109 දරණ ගොඩනැගිල්ල.

2. ඉහත කී තෙලඟපාත පිහිටි 1183 දරණ එකී පිඹුර ප්‍රකාර කැටකැලගහවත්ත නමැති ඉහත කී ඉඩමේ 9ඒ බිම් කට්ටිය වශයෙන් සළකුණු කර ඇති, ප්‍රමාණයෙන් පර්චස් බින්දුවයි හයයි දශම අටයි නවයක් වූ බිම් කොටස එහි පිහිටි සියළු දෑ.

එච්. බී. කපුවත්තේ,
සාමාන්‍යාධිකාරී.

1970 මාර්තු 9.

4-775

---

ණ. 6253.

## ලංකා රජයේ උකස් බැංකුව

ලංකා රජයේ උකස් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 1969 මාර්තු 22 වෙනි දින පවත්වන ලද රැස්වීමේදී පහත සඳහන් පරිදි විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කර සම්මත කරන ලදී :—

(1) එෆ්. බී. එල්. කොක් ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කරන ලද 1960 ජූනි 3 වෙනි දින හා අංක 831 දරණ උකස්කරය මත අංගොඩ, කැළණිමුල්ලේ අංක 82 දරණ තැන, ටෙරන්ස් අමරසිංහ මහතාගෙන් 1969.2.17 දින දක්වා මුල් මුදල හා පොළිය වශයෙන් රු. 4,278.66 ක මුදලක් හා 1969.2.18 දින සිට ගෙවනු ලබන දින තෙක් රු. 3,019.52 ක මුදල මත අවුරුද්දකට සියයට 6 පොළියක් තවදුරටත් ලැබිය යුතුයි.

(2) 1968 අංක 33 දරණ ලංකා රජයේ උකස් බැංකු හා මුදල් (සංශෝධන) පනතින් සංශෝධිත ලංකා රජයේ උකස් බැංකු ආඥපනතේ (398 අධිකාරය) 61 ඕ වගන්තියේ ප්‍රකාර පහත සඳහන් දේපොළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළඹ, අළුත්කඩේ වීදියේ අංක 227 දරණ තැන, පී. එච්. විජේසිංහ වෙන්දේසිකරුට අවසරය හා බලය දෙන ලදී.

ඉහත කී ටෙරන්ස් අමරසිංහ මහතාගෙන් ඉහත සඳහන් උකස්කරය මත අය විය යුතු රු. 4,278.66 ක මුදලක් හා 1969.2.18 දින සිට වෙන්දේසිය පැවැත්වෙන දින දක්වා රු. 3,019.52 ක මුදල මත අවුරුද්දකට සියයට 5½ බැගින් පොළියද, ලංකා රජයේ

උකස් බැංකු ආඥාපනතේ 63 වගන්තිය යටතේ අය කර ගත හැකි වියහියදම් හා මුදල් ද අය කර ගනු සඳහා, මෙම බැංකුවට ඇප වශයෙන් උකස් කර ඇති—

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ කොටුවේගොඩ පිහිටි, බලයලත් මිනින්දෝරු ජේම්ස් රුද්‍රිගු විසින් සාදන ලද 1930 ජූලි 5 දින හා 2514 දරණ පිඹුර අනුව, පර්චස් විසිහතරයි දශම පහයි හයක් (අ. 0, රූ. 0, පර්. 24.56) වූ, ඇත්පන්තිය වත්ත නමැති ඉඩමේ එෆ් දරණ බිම් කොටස හා එහි වූ ගොඩනැගිල්ල.

එච්. බී. කපුවත්තේ,
සාමාන්‍යාධිකාරී.

1970 මාර්තු 4.
4-793

---

ණ. 6264

## ලංකා රජයේ උකස් බැංකුව

ලංකා රජයේ උකස් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 1968 සැප්තැම්බර් 7 වෙනි දින පවත්වන ලද රැස්වීමේදී පහත සඳහන් පරිදි විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කර සම්මත කරන ලදී :—

(1) ඒ. එෆ්. බී. ද ඩබ්ලිව්. තිලකරත්න ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කරන ලද 1960 දෙසැම්බර් 19 දින හා අංක 575 දරණ උකස්කරය මත කොළඹ 10, ස්වැෆර්ඩ් පෙදෙසේ අංක 59 දරණ තැන ඇති රංජිතම් අර්සරත්නම් (විවාහයට පෙර මාර්ෂල්) සහ රාසයියා වික්ටර් අර්සරත්නම් (ස්වාමිපුරුෂයා සහ භාර්යාව) යන දෙදෙනාගෙන් 1968.7.11 දින දක්වා මුල් මුදල හා පොළිය වශයෙන් රු. 14,252.74 ක මුදලක් හා 1968.7.12 දින සිට ගෙවනු ලබන දින තෙක් රු. 11,771.24 ක මුදල මත අවුරුද්දකට සියයට 6 පොළියක් තවදුරටත් ලැබිය යුතුයි.

(2) 1968 අංක 33 දරණ ලංකා රජයේ උකස් බැංකු හා මුදල් (සංශෝධන) පනතින් සංශෝධිත ලංකා රජයේ උකස් බැංකු ආඥාපනතේ (398 අධිකාරය) 61ඕ වගන්තියේ ප්‍රකාර පහත සඳහන් දේපොළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළඹ, අළුත්කඩේ වීදියේ අංක 227 දරණ තැන, පී. එච්. විජේසිංහ වෙන්දේසිකරුට අවසරය හා බලය දෙන ලදී.

ඉහත කී ඇති රංජිතම් අර්සරත්නම් (විවාහයට පෙර මාෂල්) සහ රාසයියා වික්ටර් අර්සරත්නම් (ස්වාමි පුරුෂයා සහ භාර්යාව) යන දෙදෙනාගෙන් ඉහත සඳහන් උකස්කරය මත අයවිය යුතු රු. 14,252.74 ක මුදල සහ 1968.7.12 දින සිට වෙන්දේසිය පැවැත්වෙන දිනය දක්වා රු. 11,771.24 ක මුදල මත අවුරුද්දකට සියයට 6 බැගින් පොළියද, ලංකා රජයේ උකස් බැංකු ආඥාපනතේ 63 වෙනි වගන්තිය යටතේ අය කර ගත හැකි වියහියදම් හා මුදල් ද අය කර ගනු සඳහා, මෙම බැංකුවට ඇප වශයෙන් උකස් කර ඇති—

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හා නාගරිකය තුළ මරදාන කොට්ඨාශයේ ස්වැෆර්ඩ් පෙදෙසේ පිහිටි වරිපනම් අංක 59, 51/45 සහ 46 දරණ ගොඩනැගිලි සහ බලයලත් මිනින්දෝරු එච්. පී. ඩයස් මහතා විසින් සාදන ලද 1909 මැයි 10 දින හා අංක 634 දරණ පිඹුර අනුව ප්‍රමාණයෙන් පර්චස් හයක් වූ (අ. 0, රූ. 0, පර්. 6) ඔකස්පුලිතෝට්ටම් නමැති ඉඩමේ ඒ අක්ෂරය යනුවෙන් සළකුණු කර ඇති බිම් කොටස.

එච්. බී. කපුවත්තේ,
සාමාන්‍යාධිකාරී.

1970 මාර්තු 10.
4-794

---

ණ. 7763

## ලංකා රජයේ උකස් බැංකුව

ලංකා රජයේ උකස් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 1967 සැප්තැම්බර් 12 වෙනි දින පවත්වන ලද රැස්වීමේදී පහත සඳහන් පරිදි විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කර සම්මත කරන ලදී:—

(1) එම්. ටී. ගුණවර්ධන ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කරන ලද 1962 ඔක්තෝබර් 25 වෙනි දින හා අංක 640 දරණ උකස්කරය මත කොළඹ 6, ජයසිංහ පාරේ අංක 21 දරණ තැන පදිංචි කහඳලියනගේ ශ්‍රීමතී සුමිත්‍රා විජේරත්න මහත්මිය (විවාහයට පෙර ද සිල්වා) යන අයගෙන් 1967.7.7 දින දක්වා මුල් මුදල හා පොළිය වශයෙන් රු. 22,589.31 ක මුදලක් හා 1967.7.8 දින සිට ගෙවනු ලබන දින තෙක් රු. 18,444.71 ක මුදල මත අවුරුද්දට සියයට 8 පොළියක් තවදුරටත් ලැබිය යුතුයි.

(2) ලංකා රජයේ උකස් බැංකු ආඥාපනතේ (398 අධිකාරය) 62(1) වගන්තියේ ප්‍රකාර පහත සඳහන් දේපොළ මේ තීරණය රජයේ ගැසට් පත්‍රයේ පළවීමෙන් දින 21 ක් ගත වීමෙන් පසු මින් මතු නියම කරනු ලබන දිනක, කොළඹ 12, අළුත්කඩේ වීදියේ අංක 161/32 දරණ තැන එම්. වින්සන්ට් පෙරේරා වෙන්දේසිකරුට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට අවසරය හා බලය දෙන ලදී.

ඉහතකී කහඳලියනගේ ශ්‍රීමතී සුමිත්‍රා විජේරත්න මහත්මියගෙන් (විවාහයට පෙර ද සිල්වා) ඉහත සඳහන් උකස්කරය මත අය විය යුතු රු. 22,589.31 ක මුදල සහ 1967.7.8 දින සිට වෙන්දේසිය පැවැත්වෙන දින දක්වා රු. 18,444.71 ක මුදල මත අවුරුද්දකට සියයට 8 බැගින් පොළියද, ලංකා රජයේ උකස් බැංකු ආඥාපනතේ 63 වෙනි වගන්තිය යටතේ අය කර ගත හැකි වියහියදම් හා මුදල් ද අය කර ගනු සඳහා, මෙම බැංකුවට ඇප වශයෙන් උකස් කර ඇති—

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හා නාගරිකයේ සීමා තුළ වූ කිරිල්ලපොනේ, පාමංකඩ කොට්ඨාශයේ ජයසිංහ පාරේ බලයලත් මිනින්දෝරු එස්. රාජේන්ද්‍ර විසින් සාදන ලද 1961 ජූනි 26 දින හා අංක 2040 දරණ පිඹුර ප්‍රකාර බළපොකුණවත්ත නමැති ඉඩමේ, 526බී 2ඒ දරණ බිම් කට්ටිය වශයෙන් සළකුණු කරන ලද, රූඩ් එකයි, පර්චස් හතයි දශම දෙකයි බිංදුවක (අ. 0, රූ. 1, පර්. 7.20) ප්‍රමාණයෙන් යුත් බිම් කොටස සහ වරිපනම් අංක 21 දරණ ගොඩනැගිල්ල.

එච්. බී. කපුවත්තේ,
සාමාන්‍යාධිකාරී.

කොළඹ,
1970.3.17 දින.
4-792

---

## ප්‍රකාශනය

මඩකලපු දිස්ත්‍රික්කයේ කෝරළේපත්තු, ඒරාවූර් පත්තු සුළුනගර සභා සීමාව හැර ඒරාවූර් පත්තු ආදි පෙදෙස්වල පිස්සු බලු උවදුර පවතින නිසා, මෙම දිස්ත්‍රික්කයේ වැඩ බලන ආණ්ඩුවේ දිසාපති වන දේවනේසන් නේසයියා වන මම, පිස්සු බලු ආඥාපනතේ (476 වෙනි පරිච්ඡේදයේ XII වැනි කාණ්ඩයේ) 11 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ මෙම පෙදෙස පිස්සු බලු උවදුරු පෙදෙස වශයෙන් ප්‍රකාශ කරමි.

ඉහත දක්වා ඇති පෙදෙස් තුල පෞද්ගලික ගොඩනැගිල්ලක, ගෙමිදුලක හෝ ඉඩමක හැර, වෙන ප්‍රසිද්ධ ස්ථානයකදී, පාරකදී හෝ වෙනයම් ස්ථානයකදී පටියකින් බැඳ ගෙන හෝ කෙනෙකු විසින් ගෙන යනු නොලබන ඕනෑම බල්ලකු දුටු වහාම මරා දැමීමට පිස්සු බලු ආඥාපනතේ (476 වෙනි පරිච්ඡේදයේ XII වැනි කාණ්ඩයේ) 11 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ ඉඩ තිබේ.

ඩී. නේසයියා,
මඩකලපුව දිස්ත්‍රික්කයේ වැඩබලන දිසාපති.

1970 මාර්තු මස 28 වන දින,
මඩකලපුව දිසාපති කාර්යාලයේ දීය.
4-708

---

## දැන්වීමයි

කෑගල්ල දිස්ත්‍රික්කයේ රුවන්වැල්ලේ පිහිටි සංචාරක බංගලාව 1970 මැයි මස 1 වැනි දින සිට තානායමක් බවට පත් කරන බව මහජනයාගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඇස්. මාරලන්ද,
කෑගල්ලේ දිසාපති.

දිසාපති කාර්යාලය,
කෑගල්ල, 1970. 3. 25.
4-635

## විවාහ සිදුකිරීම සඳහා දේවස්ථානය ලියාපදිංචි කිරීම

විවාහ ලියා පදිංචි කිරීමේ ආඥාපණතේ (112 වැනි පරිච්ඡේදය) 10 වැනි වගන්තියේ විධිවිධාන අනුව රොබට් සමරසේකර නමැති, ලංකාවේ රෙජිස්ට්‍රා ජනරාල් වන මම, ප්‍රසිද්ධ ක්‍රිස්තියානි දෙවස්ථානයක් හැටියට ප්‍රයෝජනයට ගැනෙන පහත සඳහන් කරනු ලබන ගොඩනැගිල්ල විවාහ සිදු කිරීම සඳ විධි වූ පරිදි ලියා පදිංචි කර තිබෙන බව මෙයින් දනුම් දෙනු ලැබේ :—

| අංකය | ලියා පදිංචි කිරීමේ දිනය | විස්තරය | පිහිටීම | දේවගැතිතැන, අයිතිකරු හෝ භාරකරු | ගොඩනැගිල්ල ලියා පදිංචි කරනු ලැ ඇත්තේ කුමන ආගමක් වෙනුවෙන් |
|---|---|---|---|---|---|
| 979 | ... 1970.4.7 | ... පුල් ගොස්පල් හෝල් | ... 70, කච්චේරි, නල්ලූර් පාර, චිවිය තේරු පත්තු, නල්ලූර්, යාපනය | ගරු සැමුවෙල් වල්ලි පුරම් නල්ලයියා ... | හවුස් ඔෆ් ප්‍රේය |

රොබට් සමරසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

1970 අප්‍රියෙල් 7 වැනි දින,
රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ කාර්යාලය,
කොළඹ.

4–709

---

## 1968 අංක 48 දරණ වාරිමාර්ග (සංශෝධන) පනතින් සංශෝධිත (453 වන අධිකාරය වන) වාරිමාර්ග ආඥාපනත

1968 අංක 48 දරන වාරිමාර්ග (සංශෝධන) පනතේ 17 වන වගන්තිය මගින් සංශෝධිත ඉහත සඳහන් ආඥාපනතේ 33 වන වගන්තිය යටතේ මහනුවර ආණ්ඩුවේ දිසාපති විසින් සකස් කරන ලද පහත දක්වා ඇති යෝජනා ක්‍රමය ම විසින් අනුමත කරනු ලැබූ බව, ගොවිජන සේවා කොමසාරිස් සෙනෙවිරත්න බණ්ඩා සේනානායක වන මම, 1968 අංක 48 දරන වාරිමාර්ග (සංශෝධන) පනතේ 19 වන වගන්තිය මගින් සංශෝධිත (ලංකා ව්‍යවස්ථා ප්‍රඥප්ති සංග්‍රහයේ 453 වන අධිකාරය වන) වාරිමාර්ග ආඥාපනතේ 35 වන වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරමි.

එස්. බී. සේනානායක,
ගොවිජන සේවා කොමසාරිස්.

1970.3.18.

### සුළු වාරිමාර්ග වැඩ වැඩිදියුණු කිරීම සඳහා යෝජනා ක්‍රමය

1. වැඩයේ නම සහ විස්තරය. දේමාලේ වැව—අයි/25 (1.35×0.35)

2. යෝජනා ක්‍රමය යටතේ ජල සම්පාදනය කළහැකි ඉඩම් ප්‍රමාණය සහ ඒවායේ ස්වභාවය :—

පෞද්ගලික ඉඩම් : දල වශයෙන් අක්කර 51 යි.

රජයේ ඉඩම් : නැත.

3. එකඟවූ කොන්දේසි නම් :

(1) අවශ්‍ය වැඩයේ පහත සඳහන් වැඩ කොටස්, එනම් .—

(i) අඩි 30 ක් උස මුදුන් මට්ටම අඩි 6 ක් පළලට වැව් කන්ඩියක් ඉදිකිරීම.

(ii) සොරොව්වක් සහිත වානක් ඉදිකිරීම. ,

ඇස්තමේන්තු කළ වියදම රු. 48,000 දක්වා තැනීම රජය විසින් භාරගන්නා ලදී.

(2) රජය විසින් ඉහත සඳහන් පරිදි යථෝක්ත වැඩය භාරගෙන තිබීම සලකා එම වැඩය අවසන් කළායින් පසුව එය නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය වන සියළුම කම්කරු ශ්‍රමය සියළුම ගාස්තු රහිතව, මෙම කුඹුරුවල කට්ටි ලැබුම්කරුවන් හා අඳ ගොවියන් සහ යම් කුඹුරක කට්ටි ලැබුම්කරුවන් හෝ අඳ ගොවියන් නොමැත්තෙහි නම් එහි අයිතිකරුවන් විසින් සැපයිය යුතුයි.

(3) මෙම යෝජනා ක්‍රමය යටතේ නියමිත තම කොටස ඉටු කිරීම යම් කුඹුරක කට්ටි ලැබුම්කරුවන්ගෙන් සහ අඳ ගොවීන්ගෙන් යම් කෙනෙක් හෝ යම් කුඹුරක කට්ටි ලැබුම්කරුවන් හෝ අඳ ගොවියන් නොමැත්තෙහි නම් මෙම ඉඩම්වල අයිතිකරුවන්ගෙන් හෝ ඕනෑම පුද්ගලයෙක් යම්සේ පැහැර හැරියහොත්, ආණ්ඩුවේ දිසාපතිවරයා විසින් යම් වෙනත් පුද්ගලයකු ලවා එකී කම්කරු ශ්‍රමය ඉටු කරවා ආඥාපනතේ VII වන කොටසේ නියමිත ආකාරයට වියදම් අය කරනු ලැබේ.

4–637

---

## මහජන බැංකුව, අංක 221, යූනියන් පෙදෙස, කොළඹ

### 1963 අංක 11 දරණ මුදල් පනත

### 73 වගන්තිය යටතේ දැන්වීම

මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති තැන්ප ගියඩෝර් බ්‍රේබෲක් පානබොක්කේ වන මම, 1963 අංක 11 දර මුදල් පනතේ 73 වගන්තිය යටතේ මට පැවරී ඇති බලතල අනු මහජන බැංකුව වෙත පවරා ගෙන ඇති පහත උපලේඛනයෙහි සඳහ පවරා ගැනීමේ නියෝගයෙන් අත්කරගත් ඕනෑම දේපලක් ස ලෙසින් අයිතිවාසිකම් කියන සෑම අයෙක්ම 1970 අප්‍රේල් මස 24 දි සිට මාසයක් තුල දී, 1963 අංක 11 දරණ මුදල් පනත යටතේ ලැබ යුතු සම්පූර්ණ වන්දිය හෝ වන්දි මුදලේ කොටසක් සඳහා, කොළ 2, යූනියන් පෙදෙස, අංක 167 1/2 දරණ ස්ථානයේ පිහිටි මහජ බැංකුවේ ඉඩම් බේරුම් කිරීමේ දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැ ආකෘති පත්‍ර මාර්ගයෙන් ලිඛිත ව ආදේශ කළයුතු බව එකී පනතෙ උක්ත වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

එම ලිඛිත ආදේශපත්, කොළඹ 2, යූනියන් පෙදෙස, අංක 22 ස්ථානයේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති තැ වෙත, පිටපත් තුනකින් ඉදිරිපත් කළයුතු බව සැලකිය යුතු යි.

ජී. බී. පානබොක්කේ,
සභාපති,
මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල

1970 අප්‍රේල් මස 7 දින,
කොළඹ දීය.

### උපලේඛනය

1. අංක 14,894/3 සහ 1970.2.23 දින දරණ ලංකාණ්ඩුවේ අ විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද පැවරුම් නියෝග අංක 19.

4-681

---

## සමාගම් ආඥාපනත (145 වැනි අධිකාරය)

### 277 (3) වගන්තිය යටතේ ටූඅරිස්ට් ඉන්ස් ලිමිටඩ් නම සමාගම දැන්වීම

සමාගම් ආඥාපනතේ (145 අධිකාරය) විධිවිධාන යටතේ 1966 මාර් 11 දින සංස්ථාපිත සමාගමක් වන ටූඅරිස්ට් ඉන්ස් ලිමිටඩ් ව්‍යාපාරි කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බ විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැන්වුවහොත්, අද දින සිට තෙමස ඉකුත් වූ විට, ටූඅරිස්ට් ඉන්ස් ලිමිටඩ් නම, මෙම කාර්යාලය තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරු හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් තැන්පත් ජයරත්නම් ෆිලික්ස පොන්නම්බලම් වන මම, සමාගම් ආඥාපනතේ (145 අධිකාරය) 27 (3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ජේ. එෆ්. පොන්නම්බලම්
සමාගම් රෙජිස්ට්‍රාර්.

1970 අප්‍රේල් මස 8 දින,
කොළඹ, සමාගම් රෙජිස්ට්‍රාර්ගේ
දෙපාර්තමේන්තුවේදීය.

4-663

## සමුපකාර සමිති පිළිබඳ ආඥපනත (124 වෙනි අධිකාරය)

### සමුපකාර සමිති වසා දැමීමේ කටයුතු අවසන් කිරීම

පහත සඳහන් සමුපකාර සමිති ඒ එක එක සමිතියේ නම් ඉදිරියෙහි සඳහන් කර තිබෙන දිනයෙහි වසා දමන ලද බව, සමුපකාර සමිති පිළිබඳ ආඥපනතේ 52 (2) වෙනි වගන්තිය අනුව, මෙයින් දැනුම් දෙනු ලැබේ: —

| සමිතියේ නම | වසාදමන ලද දිනය |
|---|---|
| 1. සීමාසහිත දාපිළිගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය | 70.2.1 |
| 2. සීමාරහිත දෙරවක උඩබාගේ සමුපකාර ණයදෙන සමිතිය ... ... | 70.2.1 |
| 3. සීමාසහිත ගිඩ්ඩව වරදිවල සමුපකාර කඩ සමිතිය ... | 70.2.1 |
| 4. සීමාසහිත මගුර පළාත ගොවිද්‍රව්‍ය නිපදවීමේ හා අලෙවි කිරීමේ සමුපකාර සමිතිය ... ... | 70.2.1 |
| 5. සීමාසහිත මාමඩල සමුපකාර කඩ සමිතිය ... | 70.2.1 |
| 6. සීමාසහිත වියුනිස්ගල ගිරිදිඇල්ල වත්ත සේවකයින්ගේ සමුපකාර වෙළඳසැල් සමිතිය ... | 70.2.7 |
| 7. සීමාසහිත ගලයාය පළාත කල්‍යාණි තරුණ ගොවීන්ගේ ගොවි කර්මාන්ත සමුපකාර සමිතිය | 70.2.7 |
| 8. සීමාසහිත කනදුල්ල විවිධ සේවා සමුපකාර සමිතිය | 70.2.7 |
| 9. සීමාසහිත උඩත්තව සමුපකාර කඩ සමිතිය ... | 70.2.7 |
| 10. සීමාසහිත දකුණු පොතුපිටිය සමුපකාර කඩ සමිතිය ... | 70.2.7 |
| 11. සීමාසහිත පුවුහපුවේ ගොවිතැන් කිරීමේ හා ගොවි ද්‍රව්‍ය විකිණීමේ සමුපකාර සමිතිය ... | 70.2.19 |
| 12. සීමාසහිත බටුගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය | 70.2.19 |
| 13. සීමාසහිත තුම්පනේ තේ නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය ... ... | 70.2.19 |
| 14. සීමාසහිත සකසුරුවම්කම හා මුදල් ඉතිරිකිරීම පිළිබඳ මාකදුර ගම් කාර්‍යාංශය සහ සේවකයින්ගේ සමුපකාර සමිතිය ... ... | 70.2.19 |
| 15. සීමාසහිත දකුණු කරදෙන විවිධ සේවා සමුපකාර සමිතිය ... ... | 70.2.19 |
| 16. සීමාසහිත පෙරියකුන්චිකුලම් කුකුලන් ඇතිකිරීමේ සමුපකාර සමිතිය ... | 70.2.20 |
| 17. සීමාසහිත ගන්දර බටහිර සමුපකාර කඩ සමිතිය ... | 70.2.22 |
| 18. සීමාසහිත අම්බාලේ සමුපකාර කඩ සමිතිය ... | 70.2.22 |
| 19. සීමාසහිත කොලුගල සමුපකාර කඩ සමිතිය ... | 70.2.22 |
| 20. සීමාසහිත වැවල කම්කරු සමුපකාර සමිතිය ... | 70.2.22 |
| 21. සීමාසහිත කොලවිල් ශ්‍රී ගනේශ සමුපකාර කඩ සමිතිය ... ... ... | 70.2.22 |
| 22. සීමාසහිත සියබලාගොඩ විවිධසේවා සමුපකාර සමිතිය | 70.2.23 |
| 23. සීමාසහිත දෙහිගස්පෙ සියබලාගොඩ ගොවිද්‍රව්‍ය නිපදවීමේ සහ අලෙවි කිරීමේ සමුපකාර සමිතිය | 70.2.24 |

ආර්. බී. රාජගුරු,
සමුපකාර සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් සහ
සමුපකාර සමිති නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්.

1970 අප්‍රේල් මස 10 වෙනි දින,
කොළඹ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේදීය.

4-638

---

## පිස්සු බල්ලන්

බදුලු දිස්ත්‍රික්කයේ, දැනට බල්ලන්ගෙන් අන්තරා සිදුවිය හැකි බැවින්, පිස්සු බල්ලන් සම්බන්ධ ආඥපනතේ අංක 476. දරණ පරිච්ඡේදයේ, අංක 11 දරණ වගන්තිය යටතේ, 1970 අප්‍රේල් මස 1 දින සිට මාස හයකට එම පළාත, බදුල්ල මහ නගර සභාව, බණ්ඩාරවෙල සහ හපුතලේ පළාත් ආණ්ඩු සභා සහ වැලිමඩ, ලුණුගල, පස්සර හා හාලිඇල සුළු නගර සභාවලට අයත් ප්‍රදේශ හැර, පිස්සු බලු රෝගයට යටත් ප්‍රදේශයක් ලෙස ප්‍රකාශ කරන බව මෙයින් දැනුම් දෙමි.

2. එබැවින්, බදුලු දිස්ත්‍රික්කයේ ඉහත ප්‍රකාශනයට යටත් කළ ප්‍රදේශ තුල කොබඳින ලද හෝ අන්, කෙනෙකුගේ ගෙදරක හෝ වත්තක හැර, අල්ලා නොගෙන යන බල්ලන් ප්‍රසිද්ධ ස්ථානයක, පාරක හෝ වෙනයම් ස්ථානයක සිටියොත් ඌ වහාම මරා දමන්නට පුළුවන් බව මෙයින් දන්වනු ලැබේ.

3. අංක 14,899 හා 1970.3.26 දරණ ගැසට් පත්‍රයේ පළවූ දැන්වීම මින් අවලංගු කරමි.

ආ. මාදෙන,
බදුලු දිස්ත්‍රික්කයේ දිසාපති.

1970 අප්‍රේල් 8 වන දින,
බදුල්ලේ, දිසාපති කාර්යාලයේ දිය.

4-665

---

## කෑගල්ල දිස්ත්‍රික්කයේ බෙලිගල් කෝරලේ ආදායම් නිලධාරි කොට්ඨාශයේ ග්‍රාම සේවක කොට්ඨාශ ප්‍රතිසංස්ථාපනය කිරීම

1970 මැයි මස 1 වෙනි දින සිට කෑගල්ල පාලන දිස්ත්‍රික්කයේ බෙලිගල් කෝරලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ අංක 68 දරණ ඉඹුල්ගල ග්‍රාම සේවක කොට්ඨාශය, ඉඹුල්ගල සහ දමුණුපොල යනුවෙන් කොට්ඨාශ දෙකකට බෙදා ඇති බව මහජනතාව ගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

(අ) පහත සඳහන් ගම් අංක 68 දරණ ඉඹුල්ගල ග්‍රාම සේවක කොට්ඨාශයට ඇතුළත් වේ :—

1. ඉඹුල්ගල
2. කලන්නායක
3. රූනපාන
4. වල්කොබ්බෑවල
5. අවුගොඩ පහලගම

(ආ) පහත සඳහන් ගම් අංක 68ඒ දරණ දමුණුපොල ග්‍රාම සේවක කොට්ඨාශයට ඇතුලත් වේ :—

1. දමුණුපොල
2. අවුගොඩ ඉහලගම
3. වඳුරාදෙනිය
4. හේලින්ද වතුයාය (කොටසක්)

2. මෙම ග්‍රාම සේවක කොට්ඨාශ අයත්වන මහේස්ත්‍රාත් උසාවිය, ගම්බද උසාවිය, පොලිස් වසම, උප්පැන්න හා මරණ සහ විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය, පළාත් පාලන ආයතනයත් සහ මැතිවරණ දිස්ත්‍රික්කය සැම දෙනාගේම දැනගැනීම සඳහා මෙහි පහත දක්වමි :—

(1) මහේස්ත්‍රාත් උසාවිය :—කෑගල්ල
(2) ගම්බද උසාවිය :—දැදිගම
(3) පොලිස් වසම :—කෑගල්ල
(4) උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය :— කලුපිට පත්තුව උතුර
(5) විවාහ ලියා පදිංචි කිරීමේ කොට්ඨාශය :—බෙලිගල් කෝරළය
(6) පළාත් පාලන ආයතනය :—ගලිගමුව ගම්කාර්ය සභාව
(7 මැතිවරණ දිස්ත්‍රික්කය :—ගලිගමුව—131

එස්. මාරලන්ද,
කෑගල්ල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

1970.3.13 වැනි දින,
කෑගල්ලේ දිසාපති කාර්යාලයේ දී ය.

4-620

---

## මහාමාර්ග දෙපාර්තමේන්තුව

බටහිර කොට්ඨාශය — වේයන්ගොඩ දිස්ත්‍රික්කය

### මණ්ඩාවල-පූගොඩ මාර්ගය

1969.6.18 වැනි දින රජයේ ගැසට් නිවේදනය මගින් අංක 1/6 දරණ බෝක්කුව නැවත සෑදීම සඳහා රථවාහන ගමනාගමනය නතර කරන ලද මණ්ඩාවල-පූගොඩ මාර්ගය 1970.3.25 වැනි දින සිට නැවත විවෘත කර ඇති බව මහජනයාගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්. සෙල්වදුරෙයි,
මහාමාර්ග අධ්‍යක්ෂ වෙනුවට.

මහාමාර්ග දෙපාර්තමේන්තුව,
කොළඹ 1, 1970.4.12.

4-710

## මාතර දිස්ත්‍රික්කයේ මොරවක් කෝරළේ බටහිර ප්‍රාදේශීය ආදයම් නිළධාරි කොට්ඨාශයේ ග්‍රාමසේවක කොට්ඨාශ ප්‍රතිසංස්ථාපනය කිරීම

1970 මැයි මස 1 දින සිට මාතර පාලන දිස්ත්‍රික්කයේ මොරවක් කෝරළේ බටහිර ප්‍රාදේශීය ආදයම් නිළධාරි කොට්ඨාශයෙහි අංක 241 දරණ පල්ලෙගම ග්‍රාමසේවක කොට්ඨාශය, පල්ලේගම හා කිරිවැල්දෙල යනුවෙන් ග්‍රාමසේවක කොට්ඨාශ දෙකකට බෙදු ඇති බව මහජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

(අ) පහත සඳහන් ජනපද/ගම් අංක 241 දරණ පල්ලේගම ග්‍රාමසේවක කොට්ඨාශයට ඇතුලත් වේ :—

(1) පල්ලෙගම හා (2) පතවල

(ආ) පහත සඳහන් ගම් අංක 241ඒ දරණ කිරිවැල්ලදෙල ග්‍රාමසේවක කොට්ඨාශයට ඇතුලත් වේ :—

(1) කිරිවැල්දෙල
(2) බටේයාය
(3) කන්දිල්පාන
(4) කිරිවලගම
(5) දෙහිගම්පල
(6) තලකන්ද

2. මෙම ග්‍රාමසේවක කොට්ඨාශ අයත්වන මහෙස්ත්‍රාත් උසාවිය, ගම්සභා උසාවිය, පොලිස් වසම, උප්පැන්න, මරණ සහ විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය, පළාත් පාලන ආයතනයන් සහ මැතිවරණ දිස්ත්‍රික්කය සෑම දෙනාගේම දැනගැනීම සඳහා මෙහි පහත දක්වමි :—

| ග්‍රාමසේවක කොට්ඨාශය | මහේස්ත්‍රාත් උසාවිය | ගම්බද උසාවිය | පොලිස් වසම | උප්පැන්න මරණ හා විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය | පළාත් පාලන ආයතනය | මැතිවරණ දිස්ත්‍රික්කය |
|---|---|---|---|---|---|---|
| 1. පල්ලෙගම ... | (i) මාතර ... ... (ii) දෙනියාය සංචාරක උසාවිය | දෙනියාය ... | වරල්ල ... | පල්ලෙගම ... | දෙනියාය ගම්සභාව ... | 66—දෙනියාය |
| 2. කිරිවැල්දෙල | (i) මාතර ... ... (ii) දෙනියාය සංචාරක උසාවිය | දෙනියාය ... | වරල්ල ... | උඩුවක සහ පල්ලෙගම | දෙනියාය ගම්සභාව ... | 66—දෙනියාය |

1970 මාර්තු මස 14 දින,
මාතර කච්චේරියේදීය.

එම්. එල්. ජේ. වික්‍රමරත්න,
මාතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

4–618/1

---

## මාතර දිස්ත්‍රික්කයේ මොරවක් කෝරළේ බටහිර ප්‍රාදේශීය ආදයම් නිළධාරි කොට්ඨාශයේ ග්‍රාමසේවක කොට්ඨාශ ප්‍රතිසංස්ථාපනය කිරීම

1970 මැයි මස 1 දින සිට මාතර පාලන දිස්ත්‍රික්කයේ මොරවක් කෝරළේ බටහිර ප්‍රාදේශීය ආදයම් නිළධාරි කොට්ඨාශයෙහි අංක 240 දරණ මෙදේරිපිටිය ග්‍රාමසේවක කොට්ඨාශ, මෙදේරිපිටිය හා කොලවෙනිගම යනුවෙන් ග්‍රාම සේවක කොට්ඨාශ දෙකකට බෙදු ඇති බව මහජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

(අ) පහත සඳහන් ජනපද/ගම් අංක 240 දරණ මෙදේරිපිටිය ග්‍රාමසේවක කොට්ඨාශයට ඇතුලත් වේ :—

(1) මෙදේරිපිටිය
(2) දෙඹගොඩ
(3) ලංකගම
(4) පොද්දන හා
(5) වතුගලගම

(ආ) පහත සඳහන් ගම් අංක 240 ඒ දරණ කොලවෙනිගම ග්‍රාමසේවක කොට්ඨාශයට ඇතුලත් වේ :—

(1) වරකගොඩ (2) ඇහැලපිටිගම (3) කොලවෙනිගම

2. මෙම ග්‍රාමසේවක කොට්ඨාශ අයත්වන මහේස්ත්‍රාත් උසාවිය, ගම්සභා උසාවිය, පොලිස් වසම, උප්පැන්න, මරණ සහ විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය, පළාත් පාලන ආයතනයන් සහ මැතිවරණ දිස්ත්‍රික්කය සෑම දෙනාගේම දැනගැනීම සඳහා මෙහි පහත දක්වමි :—

| ග්‍රාමසේවක කොට්ඨාශය | මහේස්ත්‍රාත් උසාවිය | ගම්බද උසාවිය | පොලිස් වසම | උප්පැන්න මරණ හා විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය | පළාත් පාලන ආයතනය | මැතිවරණ දිස්ත්‍රික්කය |
|---|---|---|---|---|---|---|
| 1. මෙදේරිපිටිය | (i) මාතර ... ... (ii) දෙනියාය සංචාරක | දෙනියාය ... | වරල්ල ... | පල්ලෙගම ... | දෙනියාය ගම්සභාව ... | 66—දෙනියාය |
| 2. කොලවෙනිගම | (i) මාතර ... ... (ii) දෙනියාය සංචාරක | දෙනියාය ... | වරල්ල ... | පල්ලෙගම ... | දෙනියාය ගම්සභාව ... | 66—දෙනියාය |

1970 මාර්තු මස 14 දින,
මාතර කච්චේරියේදීය.

එම්. එල්. ජේ. වික්‍රමරත්න,
මාතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

6–618/2

---

## මාතර දිස්ත්‍රික්කයේ මොරවක් කෝරළේ නැගෙනහිර ප්‍රාදේශීය ආදයම් නිළධාරි කොට්ඨාශයේ ග්‍රාමසේවක කොට්ඨාශ ප්‍රතිසංස්ථාපනය කිරීම

1970 මැයි මස 1 දින සිට මාතර පාලන දිස්ත්‍රික්කයේ මොරවක් කෝරළේ නැගෙනහිර ප්‍රාදේශීය ආදයම් නිළධාරි කොට්ඨාශයෙහි අංක 246 දරණ ගින්නලිය ග්‍රාමසේවක කොට්ඨාශය ගින්නලිය හා කැටවල යනුවෙන් ග්‍රාමසේවක කොට්ඨාශ, දෙකකට බෙදු ඇති බව මහජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

(අ) පහත සඳහන් ජනපද/ගම් අංක 246 දරණ ගින්නලිය ග්‍රාමසේවක කොට්ඨාශයට ඇතුලත් වේ :—

(1) ගින්නලිය

(ආ) පහත සඳහන් ගම් අංක 246ඒ දරණ කැටවල ග්‍රාමසේවක කොට්ඨාශයට ඇතුලත් වේ :—

(1) කැටවල (2) පට්ටිගල

2. මෙම ග්‍රාමසේවක කොට්ඨාශ අයත්වන මහේස්ත්‍රාත් උසාවිය, ගම්සභා උසාවිය, පොලිස් වසම, උප්පැන්න මරණ සහ විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය, පළාත් පාලන ආයතනයන් සහ මැතිවරණ දිස්ත්‍රික්කය සැම දෙනාගේම දනගැනීම සඳහා මෙහි පහත දක්වමි :—

| ග්‍රාමසේවක කොට්ඨාශය | මහේස්ත්‍රාත් උසාවිය | ගම්බද උසාවිය | පොලිස් වසම | උප්පැන්න මරණ හා විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය | පළාත් පාලන ආයතනය | මැතිවරණ දිස්ත්‍රික්කය |
|---|---|---|---|---|---|---|
| 1. ගින්නලිය ... | (i) මාතර ... (ii) දෙනියාය සංචාරක ... | දම්පහල ... | වරල්ල ... | බෙරලපනාතර ... | බෙරලපනාතර ගම්සභාව ... | 66—දෙනියාය |
| 2. කැටවල ... | (i) මාතර ... (ii) දෙනියාය සංචාරක ... | දම්පහල ... | වරල්ල ... | බෙරලපනාතර ... | බෙරලපනාතර ගම්සභාව ... | 66—දෙනියාය |

1970 මාර්තු මස 14 දින,
මාතර කච්චේරියේදීය.

එම්. එල්. ජේ. වික්‍රමරත්න,
මාතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

4-618/3

---

## ගාලු දිස්ත්‍රික්කයේ බෙන්තොට වලල්ලාවිට කෝරලේ බටහිර ප්‍රාදේශීය අදයම් නිලධාරි කොට්ඨාශයේ ග්‍රාමසේවක කොට්ඨාශය/කොට්ඨාශ ප්‍රතිසංස්ථාපනය කිරීම

1970 මැයි මස 1 වැනි දින සිට ගාල්ල පාලන දිස්ත්‍රික්කයේ බෙන්තොට වළලලාවිටි කෝරලේ බටහිර ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශයෙහි අංක 20 දරණ බ්‍රාහ්මණවතුගොඩ ග්‍රාමසේවක කොට්ඨාශය බ්‍රාහ්මණවතුගොඩ හා පාතෙගන්ගොඩ යනුවෙන් ග්‍රාම සේවක කොට්ඨාශ දෙකකට බෙදූ ඇති බව මහජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

(අ) පහත සඳහන් ජනපද/ගම් අංක 20 දරණ බ්‍රාහ්මණවතුගොඩ ග්‍රාමසේවක කොට්ඨාශයට ඇතුළත් වේ :—

1. බ්‍රාහ්මණවතුගොඩ

(ආ) පහත සඳහන් ගම් අංක 20ඒ දරණ පාතෙගන්ගොඩ දරණ ග්‍රාමසේවක කොට්ඨාශයට ඇතුලත් වේ :—

(1) පාතෙගන්ගොඩ
(2) ගොඩගෙදර
(3) නුරුගල
(4) වැලිවතුගොඩ
(5) වරාගොඩ
(6) පන්නල
(7) ගිනිගල්ගොඩ

2. මෙම ග්‍රාමසේවක කොට්ඨාශය අයත්වන මහේස්ත්‍රාත් උසාවිය, ගම්සභා උසාවිය, පොලිස් වසම, උප්පැන්න මරණ සහ විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය, පළාත් පාලන ආයතනයන් සහ මැතිවරණ දිස්ත්‍රික්කය සැම දෙනාගේම දන ගැනීම සඳහා මෙයින් පහත දක්වමි.
මෙම හෙඩීම වෙනම ඇත

| (1) ග්‍රාමසේවක කොට්ඨාශය | (2) මහේස්ත්‍රාත් උසාවිය | (3) ගම්බද උසාවිය | (4) උප්පැන්න මරණ හා විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය | (5) පළාත් පාලන ආයතනය | (6) මැතිවරණ දිස්ත්‍රික්කය | (7) පොලිස් ස්ථානය |
|---|---|---|---|---|---|---|
| 20. බ්‍රාහ්මණවතුගොඩ ... | බලපිටිය ... | අම්බලන්ගොඩ ... | වැලිතර ... | බලපිටිය සුළු නගර සභාව ... | අංක 55—බලපිටිය ... | අම්බලන්ගොඩ |
| 20ඒ. පාතෙගන්ගොඩ ... | බලපිටිය ... | අම්බලන්ගොඩ හා කොස්ගොඩ ... | වැලිතර ... | බලපිටිය සුළු නගර සභාව හා කොස්ගොඩ ගම් සභාව ... | අංක 55—බලපිටිය ... | අම්බලන්ගොඩ |

1970 මාර්තු මස 28 දින,
ගාලු කච්චේරියේදීය.

පී. ඒ. ටී. ගුණසිංහ,
ගාලු දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

4-639/1

---

## ගාල්ල දිස්ත්‍රික්කයේ කඩවත් සතර ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශයේ ග්‍රාමසේවක කොට්ඨාශය/කොට්ඨාශ ප්‍රතිසංස්ථාපනය කිරීම

1970 මැයි මස 1 වැනි දින සිට ගාල්ල පාලන දිස්ත්‍රික්කයේ කඩවත් සතර ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශයෙහි අංක 98 දරණ මඩවලමුල්ල ග්‍රාම සේවක කොට්ඨාශය මඩවලමුල්ල උතුර හා මඩවලමුල්ල දකුණ යනුවෙන් ග්‍රාම සේවක කොට්ඨාශ දෙකකට බෙදූ ඇති බව මහජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

(අ) පහත සඳහන් ජනපද/ගම් අංක 98 දරණ මඩවලමුල්ල උතුර ග්‍රාමසේවක කොට්ඨාශයට ඇතුලත් වේ :—

1. කල්ගහහේන
2. බටගන්විල
3. කහඳුව වත්ත
4. නිදන්ගොඩැල්ල
5. විලපහල

(ආ) පහත සඳහන් ගම් අංක 98ඒ දරණ මඩවලමුල්ල දකුණ ග්‍රාමසේවක කොට්ඨාශයට ඇතුලත් වේ :—

1. මිනුවන්ගොඩ
2. අලපලාව
3. මඩපාතල (කොටසක්)

2. මෙම ග්‍රාමසේවක කොට්ඨාශය අයත්වන මහේස්ත්‍රාත් උසාවිය, ගම්සභා උසාවිය. පොලිස් වසම, උප්පැන්න මරණ සහ විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය, පළාත් පාලන ආයතනයන් සහ මැතිවරණ දිස්ත්‍රික්කය සැම දෙනාගේම දන ගැනීම සඳහා මෙහි පහත දක්වමි :—
මෙම කොටස—හෙඩින්— වෙනම ඇත.

| (1) ග්‍රාමසේවක කොට්ඨාශය | (2) මහේස්ත්‍රාත් උසාවිය | (3) ගම්බද උසාවිය | (4) උප්පැන්න මරණ හා විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය | (5) පළාත් පාලන ආයතනය | (6) මැතිවරණ දිස්ත්‍රික්කය | (7) පොලිස් ස්ථානය |
|---|---|---|---|---|---|---|
| 98. මඩවලමුල්ල උතුර ... | ගාල්ල ... | — ... | ගාල්ල ... | ගාල්ල මහ නගර සභාව ... | අංක 62—ගාල්ල ... | ගාල්ල |
| 98ඒ. මඩවලමුල්ල දකුණ | ගාල්ල ... | — ... | ගාල්ල ... | ගාල්ල මහ නගර සභාව ... | අංක 62—ගාල්ල ... | ගාල්ල |

1970 මාර්තු මස 28 දින,
ගාලු කච්චේරියේදීය.

පී. ඒ. ටී. ගුණසිංහ,
ගාලු දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

4-639/2

## ගාලු දිස්ත්‍රික්කයේ ගාලු කඩවත් සතර ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශයේ ග්‍රාමසේවක කොට්ඨාශය/කොට්ඨාශ ප්‍රතිසංස්ථාපනය කිරීම

1970 මැයි මස 1 වැනි දින සිට ගාල්ල පාලන දිස්ත්‍රික්කයේ කඩවත් සතර ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශයෙහි අංක 97 දරණ දංගෙදර ග්‍රාමසේවක කොට්ඨාශය දංගෙදර උතුර හා දංගෙදර දකුණ යනුවෙන් ග්‍රාම සේවක කොට්ඨාශ දෙකකට බෙදු ඇති බව මහජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

(අ) පහත සඳහන් ජනපද/ගම් අංක 97 දරණ දංගෙදර උතුර ග්‍රාමසේවක කොට්ඨාශයට ඇතුළත් වේ :—

1. දංගෙදර දූව
2. දංගෙදර
3. මඩපාතල (කොටසක්)
4. මස්සලවත්ත

(ආ) පහත සඳහන් ගම් අංක 97ඒ දරණ දංගෙදර දකුණ ග්‍රාමසේවක කොට්ඨාශයට ඇතුළත් වේ :—

1. වැලිවත්ත
2. වලව් වත්ත
3. දෙන් සිමන් මේස්ත්‍රිගොඩ
4. ඔරොප්පු වත්ත

2. මෙම ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් වන මහේස්ත්‍රාත් උසාවිය, ගම්සභා උසාවිය, පොලිස් වසම, උප්පැන්න මරණ සහ විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය, පළාත් පාලන ආයතනයන් සහ මැතිවරණ දිස්ත්‍රික්කය සෑම දෙනාගේම දැන ගැනීම සඳහා මෙහි පහත දක්වමි.

| (1) ග්‍රාමසේවක කොට්ඨාශය | (2) මහේස්ත්‍රාත් උසාවිය | (3) ගම්බද උසාවිය | (4) උප්පැන්න මරණ හා විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය | (5) පළාත් පාලන ආයතනය | (6) මැතිවරණ දිස්ත්‍රික්කය | (7) පොලිස් ස්ථාන |
|---|---|---|---|---|---|---|
| 97. දංගෙදර උතුර | ... ගාල්ල ... | — | ... ගාල්ල | ... ගාල්ල මහ නගර සභාව | ... අංක 62—ගාල්ල ... | ගාල්ල |
| 97ඒ. දංගෙදර | ... ගාල්ල ... | — | ... ගාල්ල | ... ගාල්ල මහ නගර සභාව | ... අංක 62—ගාල්ල ... | ගාල්ල |

1970 මාර්තු මස 28 දින,
ගාලු කච්චේරියේදීය.

පී. ඒ. ටී. ගුණසිංහ,
ගාලු දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

4–639/3

---

## කොළඹ දිස්ත්‍රික්කයේ උතුරු අලුත්කුරු කෝරළයේ 'ඒ' මීගමුව ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශයේ අංක 157 බෝලවලාන ග්‍රාමසේවක කොට්ඨාශ ප්‍රතිසංස්ථාපනය කිරීම

1970 මැයි මස 1 දින සිට කොළඹ පාලන දිස්ත්‍රික්කයේ උතුරු අළුත්කුරු කෝරළයේ '' ඒ '' ප්‍රාදේශීය ආදයම් නිළධාරි කොට්ඨාශයේ අංක 157 දරණ බෝලවලාන ග්‍රාම සේවක කොට්ඨාශය අංක 157 කුරන බෝලවලාන හා අංක 157 'ඒ' කුරණ යනුවෙන් ග්‍රාමසේවක කොට්ඨාශ දෙකකට බෙදු ඇති බව මහ ජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

( අ) පහත සඳහන් ජනපද/ගම් අංක 157 දරණ කුරන බෝලවලාන ග්‍රාමසේවක කොට්ඨාශයට ඇතුලත් වේ :—

(1) මීගමු මහ නගර සභාවේ අංක 11 බෝලවලාන කොට්ඨාශය සම්පූර්ණයෙන්

(ආ) පහත සඳහන් ගම් අංක 157'ඒ' දරණ කුරන ග්‍රාමසේවක කොට්ඨාශයට ඇතුලත් වේ :—

(1) මීගමු මහ නගර සභාවේ අංක 12—කුරණ කොට්ඨාශය සම්පූර්ණයෙන්

2. මෙම ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් වන මහෙස්ත්‍රාත් උසාවිය, ගම්සභා උසාවිය, පොලිස් වසම, උප්පැන්න මරණ සහ විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය, පළාත් පාලන ආයතනයන් සහ මැතිවරණ දිස්ත්‍රික්කය සෑම දෙනාගේම දැනගැනීම සඳහා මෙහි පහත දක්වමි.—

| ග්‍රාමසේවක කොට්ඨාශය | මහේස්ත්‍රාත් උසාවිය | ගම්බද උසාවිය | උප්පැන්න, මරණ හා විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය | පළාත් පාලන ආයතනය | මැතිවරණ දිස්ත්‍රික්කය | පොලිස් වසම |
|---|---|---|---|---|---|---|
| 1. 157—කුරන බෝලවලාන | ...මීගමුව ... | — ... | මීගමුව ... | මීගමුව මහ නගර සභාව | මීගමුව ... | මීගමුව |
| 2. 157 'ඒ' කුරන | ...මීගමුව ... | — ... | මීගමුව ... | එම ... | එම ... | මීගමුව |

1970 අප්‍රේල් මස 4 වැනිද
කොළඹ දිසාපති කාර්යාලයේදීය.

ඩග්ලස් උමගිලිය,
කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේඒජන්ත.

4–621

---

## කුරුණෑගල දිස්ත්‍රික්කයේ ග්‍රාමසේවක කොට්ඨාශ ප්‍රතිසංස්ථාපනය කිරීම

කුරුණෑගල දිස්ත්‍රික්කයේ—

(අ) බිංගිරිය ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශයේ අංක 418 වීරකොඩියාන ග්‍රාමසේවක කොට්ඨාශය දෙකට බෙදු අංක 418 වීරකොඩියාන සහ අංක 418ඒ, කොවුල්වැව යනුවෙන් ග්‍රාමසේවක කොට්ඨාශ දෙකක් ද;

(ආ) ඉබ්බාගමුව ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශයේ අංක 83 මාළුළිය ග්‍රාමසේවක කොට්ඨාශය දෙකට බෙදු අංක 83 මාළුළිය සහ අංක 83ඒ, බලගොල්ල යනුවෙන් ග්‍රාමසේවක කොට්ඨාශ දෙකක් ද;

(ඇ) ඉබ්බාගමුව ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශයේ අංක 98 හෙනව සහ අංක 103 දිද්දෙනිය යන ග්‍රාමසේවක කොට්ඨාශ දෙක තුනකට බෙදු අංක 98 හෙනව, අංක 103 දිද්දෙනිය සහ අංක 104 කිඹුල්වාන යනුවෙන් ග්‍රාමසේවක කොට්ඨාශ තුනක් ද;

1970 මැයි මස 1 වැනි දින සිට ඇති කරනු ලබන බව මහජනයාගේ දැනගැනීම පිණිස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

2. (අ) (i) පහත සඳහන් ගම් අංක 418 වීරකොඩියාන ග්‍රාමසේවක කොට්ඨාශයට ඇතුළත් වේ:—

ඉහළ වීරකොඩියාන
දිඹන්වෙල
මාවීකොටුව
දෙරඇබ
පන්වත්තේගම
පහළ වීරකොඩියාන (අංක 421 වකුවත්ත ග්‍රාමසේවක කොට්ඨාශයෙන්)

(ii) පහත සඳහන් ගම් අංක 418ඒ, කොවුල්වැව ග්‍රාමසේවක කොට්ඨාශයට ඇතුළත්වේ:—

කොවුල්වැව
හෙට්ටියකොටුව
ගොරොක්ගස්අගාරේ
මරක්කලමුල්ල
පහළ මණ්ඩකොන්ඩාන (අංක 424 කරඳාවිල ග්‍රාමසේවක කොට්ඨාශයෙන්)

(ආ) (i) පහත සඳහන් ගම් අංක 83 මාඑළිය ග්‍රාමසේවක කොට්ඨාශයට ඇතුළත් වේ:—
අගාරේ මාඑළිය රඹේ

(ii) පහත සඳහන් ගම් අංක 83ඒ, බලගොල්ල ග්‍රාමසේවක කොට්ඨාශයට ඇතුළත් වේ:—
බලගොල්ල උල්පත්වැව
දගම වීරගොල්ල
එගොඩගම

(ඇ) (i) පහත සඳහන් ගම් අංක 98 හෙනව ග්‍රාමසේවක කොට්ඨාශයට ඇතුළත් වේ:—
හෙනව උතුරුවැල්ල
නක්වත්තාගම හම්මිල්ලගොල්ල
නල්වැහැර පහළ නෙල්ලිය

(ii) පහත සඳහන් ගම් අංක 103 දිද්දෙනිය ග්‍රාමසේවක කොට්ඨාශයට ඇතුළත් වේ:—
බඹරාගල මුදුගොමුවාගම
දික්වැහැර නබඩවෙල
දිද්දෙනිය නීරම්මුල්ල
දේවගිරිය පොල්කටුව
හඳවැල්පොල සියඹලන්ගමුව

(iii) පහත සඳහන් ගම් හා ජනපද අංක 104 කිඹුල්වාන ග්‍රාමසේවක කොට්ඨාශයට ඇතුළත් වේ:—
ඉහළ නෙල්ලිය කටුපොත කිඹුල්වාන ඕය ජනපදය—යුනිට් 1, 2 සහ 3.

3. මෙම ග්‍රාමසේවක කොට්ඨාශ අයත් වන මහෙස්ත්‍රාත් උසාවිය, ගම්බද උසාවිය, පොලිස් වසම, උප්පැන්න, මරණ හා විවාහ ලියා පදිංචි කිරීමේ කොට්ඨාශය, මැතිවරණ දිස්ත්‍රික්කය හා පළාත් පාලන ආයතනය පහත දක්වේ:—

| ග්‍රාමසේවක කොට්ඨාශය | මහෙස්ත්‍රාත් උසාවිය | ගම්බද උසාවිය | පොලිස් වසම | රෙජිස්ට්‍රාර් කොට්ඨාශය | මැතිවරණ කොට්ඨාශය | පළාත්පාලන ආයතනය |
|---|---|---|---|---|---|---|
| 418, වීරකොඩියාන ... | කුලියාපිටිය ... | දුම්මලසූරිය ... | දුම්මලසූරිය ... | යගම්පත්තු කෝරළය | බිංගිරිය ... | දුම්මලසූරිය |
| 418ඒ, කොවුල්වැව ... | කුලියාපිටිය ... | දුම්මලසූරිය ... | දුම්මලසූරිය ... | යගම්පත්තු කෝරළය | බිංගිරිය ... | දුම්මලසූරිය |
| 83, මාඑළිය ... | කුරුණෑගල ... | පොල්පිතිගම ... | ගොකරැල්ල ... | දිවිගන්දහය කෝරළය | හිරියාල ... | පොල්පිතිගම |
| 83ඒ, බලගොල්ල ... | කුරුණෑගල ... | පොල්පිතිගම ... | ගොකරැල්ල ... | දිවිගන්දහය කෝරළය | හිරියාල ... | පොල්පිතිගම |
| 98, හෙනව ... | කුරුණෑගල ... | කඳුලව ... | ගොකරැල්ල ... | ඉහළඕතොට කෝරළය | හිරියාල ... | මඩහපොළ |
| 103, දිද්දෙනිය ... | කුරුණෑගල ... | කඳුලව ... | ගොකරැල්ල ... | ඉහළ ඕතොට කෝරළය | හිරියාල ... | මඩහපොල |
| 104, කිඹුල්වාන ... | කුරුණෑගල ... | කඳුලව ... | ගොකරැල්ල ... | ඉහළ ඕතොට කෝරළය | හිරියාල ... | මඩහපොළ |

1970.3.31 දින,
කුරුණෑගල, දිසාපති කාර්යාලයේදීය.

හී. බ. දිසානායක,
කුරුණෑගල දිසාපති,

4—640

---

## මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශයේ ග්‍රමසේවක කොට්ඨාශ ප්‍රතිසංස්ථාපනය කිරීම

1970 මැයි මස 1 දින සිට මහනුවර පාලන දිස්ත්‍රික්කයේ පාතදුම්බර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයෙහි අංක 176 හුරීකඩුව ග්‍රාමසේවක කොට්ඨාශය, අංක 176 හුරීකඩුව උතුර සහ 176ඒ හුරීකඩුව දකුණ යනුවෙන් ග්‍රාමසේවක කොට්ඨාශ දෙකක් ලෙස බෙද ඇති බව මහජනයාගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

(අ) පහත සඳහන් ගම් අංක 176 දරණ හුරීකඩුව උතුර ග්‍රාමසේවක කොට්ඨාශයට ඇතුළත් වේ:—
(1) ගෙදරවෙල (2) ඉත්තමාලියගොඩ
(3) හුරීකඩුව මැදගම්මැද්ද (4) පිටවල

(ආ) පහත සඳහන් ගම් අංක 176ඒ දරණ හුරීකඩුව දකුණ ග්‍රාමසේවක කොට්ඨාශයට ඇතුළත් වේ:—
(1) හුරීකඩුව (2) නිතුලේතැන්න (3) දෙඩන්ගොල්ල

2. මෙම ග්‍රාමසේවක කොට්ඨාශ අයත්වන මහෙස්ත්‍රාත් උසාවිය, ගම්බද උසාවිය, පොලිස් වසම, උප්පැන්න, මරණ සහ විවාහ ලියා පදිංචි කිරීමේ කොට්ඨාශය, පළාත් පාලන ආයතනයන් සහ මැතිවරණ දිස්ත්‍රික්කය, සැම දෙනාගේම දැනගැනීම සඳහා මෙහි පහත දක්වමි.—

| ග්‍රාමසේවක කොට්ඨාශය | පොලිස් කොට්ඨාශය | මහෙස්ත්‍රාත් උසාවිය | ගම්බද උසාවිය | උප්පැන්න මරණ හා විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය | පළාත් පාලන ආයතනය | | මැතිවරණ දිස්ත්‍රික්කය |
|---|---|---|---|---|---|---|---|
| 176, හුරීකඩුව උතුර ... | වත්තේගම ... | තෙල්දෙනිය ... | වලල ... | පාතදුම්බර උඩගම්පහ නැගෙණහිර ... | පාතදුම්බර උතුර ... | උඩගම්පහ ... | කුණ්ඩසාලේ |
| 176ඒ, හුරීකඩුව දකුණ ... | වත්තේගම ... | තෙල්දෙනිය ... | වලල ... | පාතදුම්බර උඩගම්පහ නැගෙණහිර ... | පාතදුම්බර උතුර ... | උඩගම්පහ ... | කුණ්ඩසාලේ |

1970 මාර්තු 20 දින,
මහනුවර කච්චේරියේදීය

ඩබ්ලිව්. ජේ. ප්‍රනාන්දු,
මහනුවර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ එජන්ත.

4-619

---

## 1968 අංක 48 දරණ වාරිමාර්ග (සංශෝධන) පනතින් සංශෝධිත (453 වන අධිකාරය වන) වාරිමාර්ග ආඥාපනත

1968 අංක 48 දරන වාරිමාර්ග (සංශෝධන) පනතේ 17 වන වගන්තිය මගින් සංශෝධිත ඉහත සඳහන් ආඥා පනතේ 33 වන වගන්තිය යටතේ මහනුවර ආණ්ඩුවේ දිසාපති විසින් සකස් කරන ලද පහත දක්වා ඇති යෝජනා ක්‍රමය ම විසින් අනුමත කරනු ලැබූ බව, ගොවිජන සේවා කොමසාරිස් සෙනෙවිරත්න බණ්ඩා සේනානායක වන මම, 1968 අංක 48 දරන වාරිමාර්ග (සංශෝධන) පනතේ 19 වන වගන්තිය මගින් සංශෝධිත (ලංකා ව්‍යවස්ථා ප්‍රඥප්ති සංග්‍රහයේ 453 වන අධිකාරය වන) වාරිමාර්ග ආඥාපනතේ 35 වන වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරමි.

එස්. බී. සේනානායක,
ගොවිජන සේවා කොමසාරිස්.

1970. 3. 18.

### සුළු වාරිමාර්ග වැඩ වැඩිදියුණු කිරීම සඳහා යෝජනා ක්‍රමය

(1) වැඩයේ නම සහ විස්තරය : තුම්/වැලිවිට මණින්නේ අමුණ—අයි/24 (11.85×8.55).

(2) යෝජනා ක්‍රමය යටතේ ජල සම්පාදනය කළහැකි ඉඩම් ප්‍රමාණය සහ ඒවායේ ස්වභාවය :

පෞද්ගලික ඉඩම් : දළ වශයෙන් අක්කර 15 යි.
රජයේ ඉඩම් : නැත.

(3) එකඟ වූ කොන්දේසි නම් :

(1) අවශ්‍ය වැඩයේ පහත සඳහන් වැඩ කොටස්, එනම් :—
1. අමුණක් ඉදි කිරීම,
2. ආරක්ෂක බැම් සෑදීම,
3. සොරොව්වක් ඉදි කිරීම.

ඇස්තමේන්තු කළ වියදම රු. 15,000 දක්වා නැතිම රජය විසින් භාරගන්නා ලදී.

2. රජය විසින් ඉහත සඳහන් පරිදි යථෝක්ත වැඩය භාරගෙන තිබීම සලකා එම වැඩය අවසන් කළායින් පසුව එය නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය වන සියළුම කම්කරු ශ්‍රමය සියළුම ගාස්තු රහිතව, මෙම කුඹුරුවල කට්ටි ලැබුම්කරුවන් හා අඳ ගොවියන් සහ යම් කුඹුරක කට්ටි ලැබුම්කරුවන් හෝ අඳ ගොවියන් නොමැත්තෙහි නම් එහි අයිතිකරුවන් විසින් සැපයිය යුතුයි.

3. මෙම යෝජනා ක්‍රමය යටතේ නියමිත තම කොටස ඉටු කිරීම යම් කුඹුරක කට්ටි ලැබුම්කරුවන්ගෙන් සහ අඳ ගොවීන්ගෙන් යම් කෙනෙක් හෝ යම් කුඹුරක කට්ටි ලැබුම්කරුවන් හෝ අඳ ගොවියන් නොමැත්තෙහි නම් මෙම ඉඩම් වල අයිතිකරුවන්ගෙන් හෝ ඕනෑම පුද්ගලයෙක් යම්සේ පැහැර හැරියහොත්, ආණ්ඩුවේ දිසාපතිවරයා විසින් යම් වෙනත් පුද්ගලයෙකු ලවා එකී කම්කරු ශ්‍රමය ඉටු කරවා ආඥාපනතේ 7 වන කොටසේ නියමිත ආකාරයට වියදම් අය කරනු ලැබේ.

4–689—70.4.24 දින අංක 14,903 දරන ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතු වන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම යැවිය යුතුයි.

### උපලේඛනය

### 1970

| මාසය | | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|---|
| මාර්තු | ... | 70. 3. 5 බ්‍රහස්පතින්ද | .. | 70. 2.27 සිකුරාද | දහවල් | 12.0 |
| | | 70. 3.13 සිකුරාද | ... | 70 3. 5 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 70. 3.20 සිකුරාද | ... | 70. 3.13 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 3.26 බ්‍රහස්පතින්ද | ... | 70. 3.19 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| අප්‍රේල් | ... | 70. 4. 3 සිකුරාද | ... | 70. 3.25 බදාද | ප.ව. | 3.30 |
| | | 70. 4.10 සිකුරාද | ... | 70. 4. 3 සිකුරාද | ප ව. | 3.30 |
| | | 70. 4.17 සිකුරාද | ... | 70. 4. 8 බදාද | ප.ව. | 3.30 |
| | | 70. 4.24 සිකුරාද | ... | 70. 4.17 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 4.30 බ්‍රහස්පතින්ද | ... | 70. 4.23 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| මැයි | ... | 70. 5. 8 සිකුරාද | ... | 70. 4.30 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 70. 5.15 සිකුරාද | ... | 70. 5. 8 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 5.22 සිකුරාද | ... | 70. 5.15 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 5.29 සිකුරාද | ... | 70. 5.22 සිකුරාද | ප.ව. | 3.30 |
| ජූනි | ... | 70. 6. 5 සිකුරාද | ... | 70. 5.29 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 6.11 බ්‍රහස්පතින්ද | ... | 70. 6. 5 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 6.18 බ්‍රහස්පතින්ද | ... | 70. 6.11 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | | 70. 6.25 බ්‍රහස්පතින්ද | ... | 70. 6.18 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |

1970 මාර්තු මස 5 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි.